ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

லலித் அத்துலத்முதலி மஹபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்

Lalith AthulathMudali Mahapola Higher Education Scholarship Trust Fund

2023

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு, மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு

Ministry of Trade, Commerce, Food Security and Co-operative Development

2023

වාර්ෂික වාර්තාව

ලලිත් ඇතුළත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන

ශිෂ්‍යත්ව භාර අරමුදල

පටුන

අරමුදලේ මෙහෙවර හා දැක්ම	01
මූලික වටිනාකම්	02
පසුගිය වර්ෂ 05 තුළ ලබා ගත් ජයග්‍රහණ	03
1981 සිට 2023 දක්වා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල භාර අමාත්‍යාංශය හා විෂය භාර අමාත්‍යවරයා	04
භාරකාර මණ්ඩලය - 2023	05
මෙහෙයුම් සමාලෝචනය	06-12
ආයතනික යහපාලනය	13 – 15
මහපොළ භාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන	16 – 18
මූල්‍ය ප්‍රකාශන	19 - 49
මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති වාර්තාව	50 - 59

දැක්ම (Vision)

දිළිඳුකම තුරන් කිරීම ඉලක්ක කරගත් වියත් සමාජයක් බිහිකිරීම.

මෙහෙවර (Mission)

වරප්‍රසාද නොලත් යෞවනයනට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මඟින් සම අවස්ථා ඇති කිරීම.

අරමුණු (Objectives)

- යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම.
- ද්විතියන අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර සිටින ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට උසස් අධ්‍යාපන ආයතනයකදී සිය අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා උපකාර වන ආධාර සැපයීම.
- තරුණයින්ගේ හැකියා දියුණු කිරීම සඳහා වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා ඒවායෙහි කළමනාකරණයට සහායවීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පාසල් සහ ආයතන ආදිය පිහිටුවීම හා ඒවාට ආධාර සැලසීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පුද්ගලයින්ගේ නිපුණතා නංවාලීම සහ වර්ධනය කිරීම සඳහා ආධාර සැපයීම. (දැනට ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබාදීම මූලික හා ප්‍රමුඛ කාර්යය ලෙස සලකා ක්‍රියා කර ඇත.)

මූලික වටිනාකම්

සුපිලිපන්බව (Integrity)

අප විසින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා තෝරා ගන්නා ලද සිසුන් නියමිත ක්‍රමවේදයක් යටතේ ඉතා විනිවිද භාවයකින් යුක්තව සාධාරණව සිදු කරන අතර සුදුසුකම් ලබන සිසුන්ගේ ගෙවීම් ඉතා සාධාරණ කාලයක් තුළ ඔවුන්ට ලබාදීමට නිතරම උත්සුක වේ.

නම්‍යතාවය (Flexibility)

අරමුදලේ සේවයකයින් හා අධ්‍යක්ෂ අතුලු භාරකාර මණ්ඩලය අරමුදල ශක්තිමත් කිරීම සඳහා නව අදහස් සොයා යමින් තරගකාරී මූල්‍ය වෙළඳපළ තුල ඉතා සාර්ථකව කටයුතු කරයි.

සුභවාදී ආකල්ප (Positive Attitudes)

ශිෂ්‍යත්ව ලබාදීමේදී හා අනෙකුත් ආයතන සමඟ හා විශ්ව විද්‍යාල සමඟ කටයුතු කිරීමේදී හා අරමුදල් සපයා ගැනීමේදී ඉතා විශාල අභියෝග රාශියකට මුහුණදීමට සිදුවන අතර එම සියලුම අභියෝග ඉතා සුභවාදීව ජය ගැනීමට මනා එළඹුමක් සේවකයන් තුළ පවතී.

කණ්ඩායම් හැඟීම (Team Spirit)

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි දක්වන ලෙන්ගතු බව සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරා ගැනීමෙහිලා එක්ව කටයුතු කරති.

ප්‍රතිඵලදායක බව (Effectiveness)

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සේවකයින් තුළ මනා අවබෝධයක් හා විශ්වාසනීයත්වයක් පවතින අතර ඔවුන් දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීමට නිතරම උක්සුක වේ ඉතා කුඩා සේවක සංඛ්‍යාවක් (සේවකයන් 13 ක්) තුළින් මාසිකව ශිෂ්‍යත්ව 70,000 ක් පමණ ගෙවීම් සිදු කරනු ලබයි.

විශිෂ්ඨත්වය කෙරෙහි නැඹුරුව (Tendency towards uniqueness)

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ සේවකයින් අඛණ්ඩව සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

- 2018 වර්ෂයේ දී මහපොළ ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලැබීමේ ආදායම් සීමාව රු.ලක්‍ෂ 03 සිට රු.ලක්‍ෂ 05 දක්වා වැඩි කල අතර ඒ තුළින් අතිරේක ශිෂ්‍යත්ව 4,000 ක් පමණ වැඩි විය.

- 2019 වර්ෂයේ දී ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා ඍජු බැංකු ක්‍රමය හඳුන්වා දෙන ලදී.

- සියලුම උසස් තාක්‍ෂණ ආයතනවල සිසුන් සඳහා ශිෂ්‍යත්ව වාරික මුදල රු.1,500/- සිට රු.2,500/- දක්වා රු.1,000/- කින් ඉහළ නංවන ලදි.

- 2023 වර්ෂයේ අභියෝග හමුවේ වුවද වාර්ෂිකව ලබාදෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව 1,000 කින් ඉහළ නැංවීමට හැකියාව ලැබුණි. ඒ අනුව 2021/2022 අධ්‍යයන වර්ෂයේ සිසුන් 17,000 කට ශිෂ්‍යත්ව පිරිනැමීමට කටයුතු යොදා ඇත.

- 2023 වර්ෂයේ මූල්‍ය වෙළෙඳපලේ අස්ථායි තත්ත්වය යටතේ වුවද ක්‍රමවත් මූල්‍ය කළමනාකරණය තුළින් හා වියදම් පාලනය කිරීම තුළින් 34% ක ශුද්ධ වාර්ෂික වර්ධනයක් ලබාකර ගැනීමට හැකිවිය.

- මහපොළ අරමුදලේ ප්‍රාග්ධන වත්කම් ඉහළ නංවමින් ඉදිරි 05 වසර තුළ දැනට ලබාදෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව 50% කින් පමණ ඉහළ නැංවීම සිදුකල යුතු බැවිනුත් අරමුදලේ වාර්ෂික ආදායම රු.බි.2 කින් පමණ වැඩිකල යුතුව ඇත.

1981 සිට 2023 දක්වා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල භාර අමාත්‍යාංශය හා විෂය භාර අමාත්‍යවරයා

	විෂය භාර අමාත්‍යාංශය	විෂය භාර අමාත්‍යවරයා	කාලය (වර්ෂය)
1	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා	1981 - 1983
2	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (ජාතික ආරක්ෂක අමාත්‍ය)	1984 - 1988
3	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1989-1990
4	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1991 -1992
5	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1993
6	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා	1994
7	අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු කිංස්ලි ටී වික්‍රමරත්න අමාත්‍යතුමා	1995 - 2000
8	අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ, නාවික සංවර්ධන හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය	ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා	2001
9	වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය	ගරු රවි කරුණානායක අමාත්‍යතුමා	2002 - 2004
10	වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය	ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමා	2004 මැයි - 2007
11	වෙළඳ, අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය	ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2008 - 2009
12	සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා	2010 - 2012
13	ජනාධිපති ලේකම් කාර්යාලය	ජනාධිපති ලේකම්	2013 - 2014
14	ආහාර සුරක්ෂිතා අමාත්‍යාංශය	ගරු ගාමිනී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා	2015
15	සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමා	2015 නොවැම්බර් - 2018
16	උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා	2018 ජූලි
17	නගර නිර්මාණ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා	2018 ඔක්තෝබර්- 2019 නොවැම්බර්.
18	උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2019 නොවැම්බර්
19	වෙළෙඳ අමාත්‍යාංශය	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2020 ජනවාරි සිට 2021 දෙසැම්බර්
20	වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	ගරු නලින් ප්‍රනාන්දු අමාත්‍යතුමා	2022 ජනවාරි සිට 2023 දෙසැම්බර්

	භාරකරු/භාරකරුවන්	නිලය	තනතුර
1	පී. ඒ. ප්‍රේමතිලක (2023 මැයි - 2023 ජූලි)	විශ්‍රාමික විගණකාධිපති	සභාපති
2.	ගරු නලින් ප්‍රනාන්දු අමාත්‍යතුමා (2023 ජනවාරි - 2023 දෙසැම්බර්)	වෙළඳ , වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය	සභාපති
3.	ඒ.එම්.පී.එම්.බී.අතපත්තු මහතා (2023 පෙබරවාරි - 2023 දෙසැම්බර්)	ලේකම්, වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	නිල භාරකරු
4.	එම්.එන්.රණසිංහ මහතා 2023 ජනවාරි - 2023 දෙසැම්බර්)	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	නිල භාරකරු
5.	ජ්‍යෝෂ්ඨ මහචාර්ය සම්පත් අමරතුංග මහතා (2023 ජුනි - 2023 දෙසැම්බර්)	සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම	පත්කල භාරකරු
6.	ආචාර්ය යසන්ත මදුරප්පෙරුම මහතා (2023 ජනවාරි - 2023 දෙසැම්බර්)	කථිකාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය	පත්කල භාරකරු
7.	එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර මහතා (2023 ජනවාරි - 2023 ජුනි)	පත්කල භාරකරු	පත්කල භාරකරු

ශිෂ්‍යත්ව ගෙවීම්

ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු (වාරිකයකට ගෙවනු ලබන මුදල)
විශ්ව විද්‍යාල සිසුන් සඳහා

ශිෂ්‍යත්ව වර්ගය	ශිෂ්‍යත්වයක් සඳහා ගෙවනු ලබන මුදල (රු.)	මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (රු.)	භාණ්ඩාගාර යේ දායකත්වය (රු.)
සාමාන්‍ය ශිෂ්‍යත්ව ගෙවීම්	5,000/-	2,550/-	2,450/-
කුසලතා පදනම මත ශිෂ්‍යත්ව ගෙවීම්	5,050/-	2,600/-	2,450/-

අනෙකුත් ආයතන සිසුන් සඳහා

අංකය	ආයතනයේ නම	ශිෂ්‍ය වර්ගය	මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (රු.)
1	ජාතික සමාජ සංවර්ධන ආයතනය	සාමාන්‍ය	2,150
2	බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය *	සාමාන්‍ය	2,550
3	බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය	සාමාන්‍ය	2,550
4	ශ්‍රී ලංකා නීති විද්‍යාලය	කුසලතා	2,200
		සාමාන්‍ය	2,150
5	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය SLIATE **	සාමාන්‍ය	2,500
6	ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය		***

* විශ්ව විද්‍යාලයෙන් රු.2,450/= ක් ද සමග සිසුන් වෙත රු.5,000/= ක් ලබා දෙනු ලැබේ.

** එක් ශිෂ්‍යයෙකුට වර්ෂයකට වාරික 9ක් ලබා දෙනු ලැබේ.

*** වාර්ෂිකව රු.4,000 වාරික 2 බැගින් සිසුන් 400 කට ශිෂ්‍යත්ව ලබා දෙනු ලැබේ (රු.1,600,000)

සිසුන් ඇතුළත් කරගැනීම	ශිෂ්‍ය සංඛ්‍යාව
විශ්වවිද්‍යාල සිසුන්	63,000
අනෙකුත් ආයතන හා තාක්ෂණ විද්‍යාල සිසුන්	7,254

ශිෂ්‍යත්ව ගෙවීම සඳහා වාර්ෂික පිරිවැය	**රු.බි.3.0**
අරමුදලේ දායකත්වය	රු.බි.1.6
භාණ්ඩාගාර දායකත්වය	රු.බි.1.4

විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම

වර්ෂය	17/18	18/19	19/20	20/21	21/22
විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	30,000	31,158	34,161	35,000	40,111
ආදායම් සීමාව (රු.ලක්ෂ 5 ට අඩු) අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව	15,000	20,000	17,890	20,000	26,000
මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව	14,500	14,984	15,001	15,000	16,000
ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	50%	64.1%	52%	57.1%	64.88%
මහාපොළ ලාභීන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	48%	48.%	44%	42.85%	39.88%
ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ සිසුන් අතරින් මහපොළ ලැබූ සිසුන්	96%	75%	84%	75%	61.5%

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයන් (විශ්ව විද්‍යාල අනුව) - 2021 / 22 අධ්‍යයන වර්ෂ සිසුන් සඳහා

අනු අංකය	පාඨමාලාව	තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			
			නව	පැරණි	එකතුව
1	ජීව විද්‍යාව	M	279	106	3,854
2		O	2,511	958	
3	භෞතික විද්‍යාව	M	265	39	3,062
4		O	2,409	346	
5	වාණිජ	M	281	16	2,969
6		O	2,531	141	
7	කලා/වාණිජ	M	42	41	4,661
8		O	38,000	373	
9	ඉංජිනේරු තාක්ෂණය	M	78	6	843
10		O	705	54.	
11	ජෛවපද්ධති තාක්ෂණය	M	55	6	611
12		O	499	51	
			13,863	2,137	16,000

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයන් (අනෙකුත් ආයතන)

ආයතනය		ශිෂ්‍ය සංඛ්‍යාව
1	ශ්‍රී ලංකා නීති විද්‍යාලය	25
2	ජාතික තාක්ෂණ ආයතනය, මොරටුව	170
3	බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය	26
4	බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය	20
5	ජාතික සමාජ සංවර්ධන ආයතනය (උපාධි 10 ඩිප්ලෝමා)	10
6	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	1500
7	ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය	400
	එකතුව	**2151**

සමස්ථ අරමුදල



ආයෝජන කළඹ - ප්‍රධාන අරමුදල



	රු.මි.
භාණ්ඩාගාර බැඳුම්කර	3,456
භාණ්ඩාගාර බිල්පත	10,120
ප්‍රතිමිලදීගැනුම්	1,355
ස්ථාවර තැන්පතු	1900
එකතුව	16,831

ආයෝජන ආදායම - ප්‍රධාන අරමුදල



	රු.මි.
භාණ්ඩාගාර බිල්පත් පොලී	1,514
භාණ්ඩාගාර බැඳුම්කර පොලී	614
ණයකර පොලී	10
ස්ථාවර තැන්පතු පොලී	258
වෙනත් ආදායම්	65
එකතුව	2.462

සමස්ථ ආදායම 2023



	රු.මි.
ආයෝජන ආදායම	2,461
ලොතරැයි ලාභය	1,519
SLIIT කුළිය	25
එකතුව	4005

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ,

2023.12.31 දිනට ආදායම් හා වියදම් විශ්ලේෂණය

(රු.මි.)

ආයෝජන ආදායම්	31.12.2023	31.12.2022	විචලනය
භාණ්ඩාගාර බැඳුම්කර	614.3	726.7	12.4%
භාණ්ඩාගාර බිල්පත්	1,513.7	628.9	26.2%
ණයකර පොලී	9.7	110.8	1.2%
අනෙකුත් ස්ථාවර තැන්පතු ශුද්ධ පොලී	258.1	272.1	85.9%
වෙනත් ආයෝජන ආදායම්	65.5	33.2	67.5%
මුළු ආයෝජන ආදායම	**2,461.3**	**1,771.7**	**11.4%**
සෘජු වියදම්			
භාරකාර ගාස්තු - BOC ආයෝජන ගිණුම	(0.7)	(2.7)	-2%
ශුද්ධ ආයෝජන ආදායම්	**2,460.6**	**1,769.0**	**-8%**
වෙනත් ආදායම්			
සංවර්ධන ලොතරැයි (DLB) ලාභ කොටස්	1,518.9	1,381.8	-3%
SLIIT වාර්ෂික බදු කුලිය	25.0	25.0	0%
වෙනත් ආදායම්	2.2	0.4	
මුළු වෙනත් ආදායම්	**1,546.1**	**1,407.2**	**-3%**
මුළු ආදායම්	**4,006.7**	**3,176.2**	**-5%**
වියදම්			
ශිෂ්‍යත්ව ගෙවීම්	(1,600.4)	(1,366.5)	-24%
වැටුප් හා වේතන	(16.7)	(16.9)	-1%
ක්ෂය	(30.7)	(31.0)	2%
වෙනත් පරිපාලන වියදම්	(15.9)	(15.3)	7%
මුළු වියදම්	**(1,663.7)**	**(1,429.7)**	**-23%**
මුළු ශුද්ධ අතිරික්තය	**2,343.0**	**1,746.1**	**19%**

භාරකාර මණ්ඩල හා ආයෝජන කළමණාකරන කමිටු රැස්වීම්

භාරකාර මණ්ඩල රැස්වීම් (The Board of Trustees Meeting)

භාරකාර මණ්ඩල රැස්වීම් වලදී ආයතනික මෙහෙයුම් හා ප්‍රතිඵල අනුමත කරගත් අයවැය හා අදාල ප්‍රමිතීන්ට සාපේක්‍ෂව ඉතා සූක්‍ෂම ලෙස නිරීක්‍ෂණය කිරීම හා අධීක්‍ෂණය කිරීම භාරකාර මණ්ඩලය විසින් සිදුකරනු ලබයි. මෙහිදී භාරකාර මණ්ඩලය සම්මත න්‍යාය පත්‍රයක් සහ අනෙකුත් සාකච්ඡා කල කාරණා කෙරෙහි අවධානය යොමු කරයි. සියලුම භාරකාර මණ්ඩල රැස්විම් වාර්තා සභාපතිවරයා විසින් අනුමත කොට සහතික කරයි. භාරකාර මණ්ඩලය මාස 02 කට වරක් රැස්වන අතර, අවශ්‍යතා පැන නැඟුනවිට විශේෂ භාරකාර මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලබේ. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල දී පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීම් සහ භාරකරුවන්ගේ සහභාගී වූ තොරතුරු පහත පරිදි වේ.

	භාරකරු/ භාරකරුවන්	තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන			
			2023. 02.07	**2023. 05.15**	**2023. 09.05**	**2023. 11.24**
			97	**98**	**99**	**100**
1	පි.ඒ ප්‍රේමතිලක මහතා	විශ්‍රාමික විගණකාධිපති (සභාපති)		√	-	-
2	ගරු නලින් ප්‍රනාන්දු අමාත්‍යතුමා මහතා	වෙළඳ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය	√	√	√	√
3	ඒ.එම්.පි.එම්.බි. අතපත්තු මහතා	ලේකම්, වෙළඳ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය,	√	√	√	√
4	එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර මහතා	පත්කල භාරකරු	√	√	-	-
5	එම්.එන් රණසිංහ මහතා	ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	√	√	√	*
6	ආචාර්ය යසන්ත මදුරප්පෙරුම මහතා	පත්කල භාරකරු	√	√	√	√
7	සම්පත් අමරතුංග මහතා	පත්කල භාරකරු			√	√

√ - සහභාගී වූ රැස්වීම් ගනන
\- - භාරකාර මණ්ඩලයෙන් ඉවත් වී ඇත
* - සහභාගිවී නැත

ආයෝජන කමිටු රැස්වීම් (Investment Committee Meeting)

2023 වර්ෂය තුල භාර අරමුදල විසින් පත්කළ ආයෝජන කමිටුව විසින් පවත්වන ලද රැස්වීම් පිළිබඳ ප්‍රගතිය පහත පරිදි වේ.

	නම	තනතුර	නිල තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන
				1 (2023/04/27)
				12 වෙනි
1	ඒ.එම්.පි.එම්.බි. අතපත්තු මහතා	සභාපති	ලේකම්, වෙළඳ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය,	√
2	එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර මහතා	සාමාජික	පත්කළ භාරකරු	√
3	මංජුල ද සිල්වා මහතා	සාමාජික	ප්‍රධාන විධායක නිළධාරී ලංකා වාණිජ මණ්ඩලය	√
4	අරවින්දි ද සිල්වා මහත්මිය	සාමාජික	ප්‍රධානමුල්‍යනිළධාරි,වෙළ ඳ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය,	√
5	එම්.පී. බණ්ඩාර මහතා	සාමාජික	අධ්‍යක්ෂ / මහපොළ අරමුදල	√
6	ටී.ධර්මරාජ මහතා	සාමාජික	වරලත් ගණකාධිකාරී	√

කාර්යය මණ්ඩලය

සේවා ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	4	-	4
තෘතීය	2	2	-
ද්විතීය	**12**	**9**	**3**
ප්‍රාථමික	4	2	**2**
එකතුව	**22**	**13**	**9**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල අවම කාර්යය මණ්ඩල පිරිවැයක් දරණ ආයතනයක් ලෙස එහි ආරම්භයේ සිටම ඉතා සීමිත කාර්යය මණ්ඩලයක් මගින් කටයුතු කරන අතර කාර්යය මණ්ඩල පරිපාලන වියදම ආදායමෙන් 0.62% ක් වූ අතර වියදමින් 1.9% වැනි ඉතා අවම මට්ටමක තබා ගත හැකි විය.

කාර්යය මණ්ඩලයෙහි දැනට පවතින ඇබෑර්තු අභ්‍යන්තර උසස් කිරීම් මගින් පිරවීමටත් ඉන්පසු ඇතිවන තනතුරු සඳහා ඇබෑර්තු බාහිර අයදුම්කරුවන්ගෙන් පිරවීමටත් භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.

සමාලෝචිත වර්ෂයේදි මහපොළ අරමුදලේ භාරකාර මණ්ඩලයේ නිර්දේශය අනුව වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය එක් එක් සේවා කාණ්ඩයේ අවශ්‍ය සේවක සංඛ්‍යා තනතුරු සහ සුදුසුකම් ආදිය තීරණය කිරීම පිණිස බඳවා ගැනීමේ පටිපාටිය සහ සංවිධාන ව්‍යුහය සමගින් සේවක සංඛ්‍යා පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීම පිණිස කමිටුවක් පත් කරන ලදි. සේවක සංඛ්‍යාව සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේද අනුමැතියද ලැබී ඇත. බඳවා ගැනීමේ පටිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය (Development Lotteries Board)

මහපොළ භාර අරමුදලේ රු. මිලියන 2.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජනය කොට ඇති අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිල බලයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙක් පත්වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් උපයන ආදායම ජනාධිපති අරමුදලට කෙලින්ම මාරු කරන අතර ඉන්පසුව මහපොළ අරමුදලට හිමි ලාභ කොටස ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරු කරනු ලැබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩල 2019 – 2023 ලාභය හා ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරුකරන ලද ලාභ කොටස

විස්තරය	2019 රු.	2020 රු.	2021 රු.	2022 රු.	2023 රු.
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුද්ධ ලාභය	2,187.60	2,668.80	2,770.00	3,210.00	3,622.51
මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කල කොටස	780.60	922.30	1,153.30	1,387.77	1,365.83

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම (NWCL)

මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ හිමිකාරීත්වය යටතේ නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) හි රුපියල් මිලියන 985 ක් ආයෝජනය කරමින් සීමිත සමාගමක් ලෙස 2003 මාර්තු 23 වන දින සංස්ථාගත කර ඇත. නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් ආයෝජන කළමණාකරුවෙකු ලෙස කටයුතු කර ඇති අතර මහපොළ භාරකාර අරමුදලෙහි ආයෝජන කළඹ අඩු අවදානමකින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ අභිප්‍රායෙන් කළමනාකරන ගිවිසුමක් යටතේ ලබා දී ඇත. එලෙස නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් කළමණාකරනය කරන ලද මහපොළ අරමුදල 2019 වර්ෂයේ ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ඇති මහ පොළ ප්‍රධාන ගිණුමට මාරු කර ඇති අතර 2019 පෙබරවාරි 28 වන දින සිට නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ තිබූ අරමුදල් කළමනාකරණ ගිවිසුම අවලංගු කර ඇත. 2023 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සකස් කර එම සමාගම විසින් මේ වන තෙක්ම ඉදිරිපත් කර නොමැත.

නැට් වෙල්ත් සිකියුරිටීස් සමාගම (NWSL)

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ උප සමාගමක් වශයෙන් NWSL ආරම්භ කර ඇති අතර 2020.10.26 වන දින පැවති අමාත්‍ය මණ්ඩලයේදී අනුමත කළ පරිදි NWCL සහ NWSL සමාගම් ඇවර කිරීමට තීරණය කර ඇත. 2021 මාර්තු සියලුම සේවකයින් ගේ සේවය අවසන් කර ඇති අතර වන්දි මුදල් හා පාරිතෝෂික ගෙවා ඇත. (2022 වාර්ෂික වාර්තාව අනුව)

මෙම සමාගමේ 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය මේ වන තෙක්ම ඉදිරිපත් කර නොමැත.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි ආයෝජන (SLIIT)

2015 මැයි 12 දින ඇති කර ගන්නා ලද ගිවිසුම් භාරකරුවන්ගේ නිසි අනුමැතියකින් තොරව සිදු කොට ඇති අතර ඒ පිළිබඳව විශේෂ විමර්ෂණයක් ජනාධිපති විමර්ෂණ කොමිසම විසින් සිදු කල අතර විගණකාධිපති වරයාගේ විශේෂ වාර්තාව අනුව මෙම මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ වත්කම් පැවරීම නිසි අනුමැතියකින් තොරව සිදු කොට ඇති බැවින් SLIIT හි පරිපාලනය නැවත මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ පිහිටුවීම COPE කමිටුව තීරණය කොට ඇත. දැනට SLIIT ආයතනය සතුව රු.බි.40කට අධික දළ වත්කම් වටිනාකමක් ඇති බව නිරීක්‍ෂණය වන අතර ඒ සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට මහපොළ භාරකාර මණ්ඩලය තීරණය කර ඇති අතර, ඒ සඳහා SLIIT හි වර්තමාන පාලන අධිකාරිය අවශ්‍ය පහසුකම් ලබා දීමට එකග නොවීම මත එම වත්කම් තක්සේරු කටයුතු සිදු නොකළ අතර එමගින් මහපොළ අරමුදලට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වී ඇත.

2021 ඉදිරි පත් කරන ලද අමාත්‍ය මණ්ඩලයේ සංදේශය අනුව SLIIT ආයතනය සමග එළඹි ගිවිසුම් සාවද්‍ය හා නිසි අනුමැතියකින් සිදු කොට නැති බව නිරීක්ෂණය කොට SLIIT හි පරිපාලණ ව්‍යුහය 2015.05.12 වැනි දිනට පෙර පැවති තත්වයෙන් පවත්වාගෙන යා යුතු බවට තීරණය කරන ලදී. ඒ අනුව මහපොළ භාරකාර මණ්ඩලය අවශ්‍ය පියවර ගනිමින් පවතී.2021 වර්ෂයේ SLIIT ආයතනය රු. මි. 500 කට අධික ලාභයක් ලබා ඇති අතර එය මහපොළ අරමුදලට ගෙවිය යුතු ලාභ කොටසකි.මෙය අඩු පහසුකම් සහිත පවුල් වල දරුවන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම් අහිමි කොට ඇති අතර මේ පිළිබඳ සියළු දෙනාගේ අවධානය යොමු වේවායි බලාපොරොත්තු වේ.

මූල්‍ය ප්‍රකාශන

31 දෙසැම්බර් 2023

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය *(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)*

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2023	2022
ආදායම	7	4,005,262,849	3,178,564,254
සෘජු වියදම් (ශිෂ්‍යත්ව ගෙවීම්)	8	(1,600,405,994)	(1,366,549,835)
		2,404,856,855	**1,812,014,419**
වෙනත් ආදායම	9	2,221,485	472,798
මුළු ආදායම		**2,407,078,340**	**1,812,487,217**
පරිපාලන වියදම්	10	(63,956,962)	(65,799,943)
මූල්‍ය පිරිවැය	11	(85,930)	(71,020)
මුළු වියදම්		**(64,042,892)**	**(65,870,963)**
බදු පූර්ව අතිරික්තය/(හිඟය)		**2,343,035,448**	**1,746,616,255**
ආදායම් බදු වියදම්		-	-
ශුද්ධ අතිරික්තය/(හිඟය)		**2,343,035,448**	**1,746,616,255**
වෙනත් විස්තීරණ ආදායම/ (වියදම)			
වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ වටිනාකමට ණය සාධනපත්‍ර මත ශුද්ධ ලාභය/(අලාභය)		1,409,471,726	(1,618,296,642)
වර්ෂය සඳහා විස්තීරණ ආදායමෙන් පසුව ශුද්ධ අතිරික්තය		**3,752,507,174**	**128,319,613**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි .
පිටු 05 සිට 26 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි .

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය *ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි*

දෙසැම්බර් 31 දිනට	සටහන්	2023	2022 (ප්‍රතිවර්ගීකරණය කරන ලද)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**12**	2,231,510	6,082,052
අස්පෘශ්‍ය වත්කම්	**13**	175,159	422,219
ආයෝජන දේපළ	**14**	1,130,911,119	1,157,524,137
පරිපාලිත සමාගමේ අයෝජනය	**15**	985,000,000	985,000,000
වෙනත් ආයෝජන	**16**	2,200,000	2,200,000
මූල්‍ය වත්කම්	**17**	16,831,072,295	12,420,137,778
ජංගම නොවන මුළු වත්කම්		**18,951,590,082**	**14,571,366,186**
ජංගම වත්කම්			
වෙනත් වත්කම්	**18**	7,616,064	2,465,271
අත්තිකාරම් හා පෙරගෙවීම්	**19**	2,084,812	2,406,567
අනෙකුත් ලැබිය යුතු දෑ	**20**	1,557,583,531	1,444,206,429
NWSL වෙතින් ලැබිය යුතු		-	17,473,951
මුදල් හා මුදලට සමාන දෑ	**21**	40,116,915	66,074,097
මුළු ජංගම වත්කම්		**1,607,401,322**	**1,532,626,314**
මුළු වත්කම්		**20,558,991,404**	**16,103,992,500**
ස්කන්ධ හා බැරකම්			
ස්කන්ධ			
සමුච්චිත අරමුදල		10,147,376,951	10,147,376,951
මූල්‍ය වත්කම් සංචිත		(377,621,576)	(1,787,093,302)
රඳවාගත් ඉපැයුම්		9,371,806,295	7,211,698,897
මුළු ස්කන්ධ		**19,141,561,671**	**15,571,982,547**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම	**22**	5,722,290	5,271,808
මුළු ජංගම නොවන බැරකම්		**5,722,290**	**5,271,808**
ජංගම බැරකම්			
උපචිතවීම් හා අනෙකුත් ගෙවිය යුතු දෑ	**23**	730,679,804	526,578,821
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල - NWSL	**24**	680,269,469	-
බැංකු අයිරාව	**25**	758,170	159,325
මුළු ජංගම බැරකම්		**1,411,707,444**	**526,738,146**
මුළු ස්කන්ධ හා බැරකම්		**20,558,991,404**	**16,103,992,500**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම හා ඉදිරිපත් කිරිම සඳහා භාරකාර මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන භාරකාර මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත.

අ.කළේ.
ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මයා
ලේකම්
වෙළඳ අමාත්‍යාංශය
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ නිල බලයෙන් භාරකාර

අ.කළේ.
ආචාර්ය වයි. මදුරප්පෙරුම මයා
පත්කළ භාරකාර
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

අ.කළේ.
එම්. පරාක්‍රම බණ්ඩාර මයා
අධ්‍යක්ෂ
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

අ.කළේ.
ලක්ෂ්මි දර්ශිකා මිය.
ගණකාධිකාරී(වැ.බ).
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි

පිටු 05 සිට 26 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි .

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

		සමුච්චිත අරමුදල	FVTOCI මූල්‍ය වත්කම් සංචිතය	රඳවාගත් ඉපැයීම්	එකතුව
2022 ජනවාරි 01 දිනට ශේෂය		**10,147,376,951**	**(168,796,660)**	**5,487,540,598**	**15,466,120,889**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟය)		-	-	1,746,616,255	1,746,616,255
මුළු වියදම්		-	(1,618,296,642)	-	(1,618,296,642)
පෙර වසර ගැලපීම්	**(සටහන I)**	-	-	(22,457,956)	(22,457,956)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		**10,147,376,951**	**(1,787,093,302)**	**7,211,698,897**	**15,571,982,547**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟ)		-	-	2,343,035,448	2,343,035,448
වෙනත් විස්තීරණ ආදායම/ (වියදම)		-	1,409,471,726	-	1,409,471,726
පෙර වසර ගැලපීම්	**(සටහන II)**	-	-	(182,928,049.68)	(182,928,050)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය		**10,147,376,951**	**(377,621,576)**	**9,371,806,295**	**19,141,561,671**

සටහන 1

පෙර වසර ගැලපීම නියෝජනය කරන්නේ , පෙර වසරට අදාළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයේ කොටස නිවැරදි කිරීමයි .

සටහන II

2022 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දායක මුදල නිවැරදි කිරීම

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
පිටු 05 සිට 26 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි .

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය *ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි*

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023	2022
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
ශුද්ධ අතිරික්තය/ (හිග)	**2,343,035,448**	**1,746,616,255**
ගැලපීම්:		
ක්ෂය වීම	30,729,822	31,299,967
ස්ථාවර වත්කම් බැහැර කිරීම මත ලාභය	-	-
පාරිතෝෂිතය	450,483	366,333
පෙර වසර ගැලපීම්	(182,928,050)	(22,457,956)
කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීමට පෙර මෙහෙයුම් අතිරික්තය	**2,191,287,703**	**1,755,824,599**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
අනෙකුත් ලැබිය යුතු දේවල වැඩි වීම /අඩුවීම	(100,732,190)	(1,077,115,933)
අනෙකුත් ගෙවිය යුතු දේවල වැඩි වීම /අඩුවීම	884,370,453	460,777,314
මෙහෙයුම් වලින් මුදල්	**783,638,262**	**(616,338,619)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම් / ගලා යාම	**2,974,925,965**	**1,139,485,980**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	(19,201)	(81,500)
අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම	-	-
ස්ථාවර වත්කම් බැහැර කිරීම මගින් විකුණුම් උත්පාදන	-	51,000.00
මූල්‍ය වත්කම්වල ආයෝජන/ (ආපසු ගැනීම)	(3,001,462,791)	(1,076,795,241)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම් / (ගලා යාම).	**(3,001,481,992)**	**(1,076,825,741)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම් / (ගලා යාම).	-	-
මුදල් හා මුදල් සමාන දේවල ශුද්ධ වැඩිවීම /අඩුවීම	**(26,556,027)**	**62,660,239**
	65,914,772	1,926,327
දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ	**39,358,745**	**64,586,566**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි

පිටු 05 සිට 26 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි .

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල
2023 දෙසැම්බර් 31න් අවසන් වසර වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 පොදු

ලලිත් ඇතුලත්මුදල මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල 1981 අංක 81 දරන පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කරන ලද භාර අරමුදලක් වන අතර භාර අරමුදලේ කළමනාකරණය හා පාලනය භාරකාර මණ්ඩලයක් වෙත පවරනු ලැබ ඇත. එය කොළඹ 02 වොක්සෝල් වීදියේ අංක 27හි සතොස මහලේකම් කාර්යාලයේ 8 වන මහලේ පිහිටා තිබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

වරප්‍රසාද නොලත් යෞවනයන්ට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මගින් සම අවස්ථා ඇති කිරීම.

1.2.1 ලලිත් ඇතුලත්මුදල මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

අරමුදලෙහි අරමුණු සහ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම.

(ආ) සතුටුදායක ලෙස තම ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කර සිටින, ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට තමන්ගේ ශාස්ත්‍රීය, කාර්මික හෝ තාක්ෂණ අධ්‍යාපනය අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයක හෝ කාර්මික නැතහොත් උසස් අධ්‍යාපන ආයතනයක සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි ඔවුන්ට ආධාර සැපයීම;

(ඇ) යෞවනයන්ට තමන්ගේ වෘත්තීය නිපුණතා හා දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි, වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා කළමනාකරණය කිරීමට සහායවීම;

(ඈ) අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව ඇති පාසල්, ආයතන, පදනම් සහ වෙනත් එවැනි ආයතන පිහිටුවීම සහ ඒවා කළමනාකරණය කිරීමෙහි ලා සහ පවත්වා ගෙන යාමේ ලා සහායවීම;

(ඉ) අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩි දියුණු කිරීම සඳහා ආධාර සැලසීම;

1.3 නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

2024 අප්‍රේල් 05 වැනි දින භාරකාර මණ්ඩල යෝජනා සම්මතයක් ප්‍රකාරව, 2023 දෙසැම්බර් 21න් අවසන් වසර සඳහා ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහාවූ සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් (LKAS) සමන්මිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කර ඇත.

2.2 මැණීමේ පදනම

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සහ ඓතිහාසික පිරිවැය සම්මුතිය මත සකස් කර තිබේ.

ආයතනයේ ව්‍යවහාරික සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබේ.

2.3 ප්‍රමාණාත්භාවය සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදරිපත් කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 (LKAS 01) අනුව සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇත.

හඳුනාගත් වටිනාකම හිලව් කිරීම බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතින්නේ නම් පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරනු ලබන අතර එසේ සිදුකරනු ලබන්නේ ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කිරීමට සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණි. මූල්‍ය ප්‍රතිපත්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ඕනෑම ගිණුම්කරණ ප්‍රමිතියක් අරථ දැක්වීමක් මගින් නියම කර තිබේ නම් හෝ අවසර ලබා දි ඇත්නම් හෝ මිස ආදායම් ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් හිලව් කරනු නොලැබේ.

2.4 සංසන්දනාත්මක තොරතුරු

නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත උපයෝගී කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් කිරීමට සිදු වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හැර, 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' LKAS 01 ප්‍රකාරව පූර්ව මුදල් වර්ෂයේදී භාර අරමුදල

විසින් යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වර්ෂයේදී ද සංගතව භාවිතා කර තිබේ. තවද, වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වනු පිණිස අවශ්‍ය තන්හිදී සංසන්දනාත්මක තොරතුරු ප්‍රතිවර්ගීකරණය කර තිබේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී උපයෝගී කරගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අන්‍යාකාරයකින් දක්වා ඇත්තේ නම් මිස, මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා නිත්‍ය වශයෙන්ම උපයෝගි කර ගෙන තිබේ.

3.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1 හඳුනාගැනීමේ පදනම

සේවා සැපයීමේ සහ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ යන ස්පෘශ්‍ය අයිතම වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීම අපේක්ෂා කෙරේ.

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් සහ වත්කම්වල පිරිවැය විශ්වශනීයව ගණනය කළ හැක්කේ නම් දේපළ, පිරියත හා උපකරණ හඳුනාගනු ලැබේ.

3.1.2 මැණීමේ පදනම

වත්කම් වශයෙන් හඳුනාගැනීමට සුදුසුවන්නා වූ දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මුලින්ම පිරිවැයට මණිනු ලැබේ. අදාළ වත්කම් ලබාගැනීම සඳහා සෘජුවම ආරෝපණීය වියදම සහ පසුව ඒ සඳහා කොටසක් එක් කිරිමට හෝ පැරණි කොටසක් ප්‍රතිස්ථාපනය සඳහා වැය වන මුදල පිරිවැය සඳහා අන්තර්ගත වේ. ස්වයං නිර්මිත වත්කම් සඳහා අමුද්‍රව්‍ය වෙනුවෙන් වැයවන පිරිවැය සහ සෘජු ශ්‍රමය, අයිතම ගෙන ඒම සහ ඒවා තබනු ලබන ස්ථානයේ ස්ථානගත කිරීම සහ ප්‍රාග්ධනිත ණය ගැනීමේ පිරිවැය ආදී සෘජුවම ආරෝපණීය වෙනත් ඕනෑම ආකාරයේ පිරිවැය අන්තර්ගත වේ. මිලදී ගන්නා ලද මෘදුකාංගය අදාළ උපකරණයේ ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යාවශ්‍ය වන්නේ නම් එය පරිගණක උපකරණයේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනිත කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක කොටසක් සතුව විවිධ ඵලදායී ජීව කාල පවතින විට ඒවා දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) වශයෙන් හඳුන්වනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ සඳහා භාර අරමුදල පිරිවැය ආකෘතිය යොදා ගන්නා අතර සමුච්චිත ක්ෂයවීම සහ යම් උපචිත හානිකරණ අලාභ අඩු කොට මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් මත යම් ආනුෂංගික වියදම් සමගින් ඒවායේ පිරිවැයට වාර්තා කරනු ලබයි.

3.1.3 තදනන්තර පිරිවැය

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක කොටසක් තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් හා එහි පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකි නම්, එබඳු කොටසක ප්‍රතිස්ථාපන පිරිවැය එම අයිතමයෙහි ධාරණ අගයට හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණ දෛනිකව සේවා කිරීම සඳහා වැය වන පිරිවැය, එය වැය වන ආකාරයට ලාභ හෝ අලාභ වශයෙන් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

3.1.4 අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු

අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඒවා දරන ලද මූල්‍ය කාලයට අදාළව ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලැබේ. වත්කමක හඳුනාගත් කොටසක වඩාත්ම මෑතකාලීන ප්‍රතිස්ථාපනය ඉක්මවා අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හැකියාවක් පවතින විටදී ප්‍රධාන ප්‍රතිසංස්කරණයක පිරිවැය වත්කමේ ධාරණ වටිනාකමේ අන්තර්ගත කර ඇත. ආශ්‍රිත වත්කමේ ඉතිරි ප්‍රයෝජනවත් ජීවිත කාලය අතරතුර ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් ක්ෂය කරනු ලැබේ.

3.1.5 හඳුනාගැනීම ඉවත්කිරීම

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් භාවිතා කිරීම හෝ බැහර කිරිම මත අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට එහි හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. වත්කමක හඳුනාගැනිම ඉවත්කිරිම මගින් ඇතිවන කිසියම් ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීම් උත්පාදන සහ ධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලබන) වත්කමේ හඳුනාගැනීම ඉවත් කරනු ලැබූ වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ "අනෙකුත් මෙහෙයුම් වියදම්හි" හඳුනාගනු ලැබේ.

3.1.6 ක්ෂයවීම

වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් සමීපව මෙම ක්‍රමවේදය මගින් පිළිබිඹු කරන බැවින් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ක්ෂයවීම හඳුනාගනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටසේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයටය.

ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි හා සවිකුරු	අවුරුදු 40
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	අවුරුදු 05
කාර්යාල උපකරණ	අවුරුදු 05
පරිගණක හා උපාංග	අවුරුදු 04
මෝටර් වාහන	අවුරුදු 05

දේපළ, පිරියත හා උපකරණ අයිතමයන්හි එක් එක් විශේෂ කොටස සඳහා ක්ෂයවීමේ අනුපාතය ඒවා භාවිතය සඳහා පවතින කාලයේදී, එනම් ඒවා අදාළ ස්ථානයේ තිබෙන විට සහ කළමනාකාරිත්වය විසින් අපේක්ෂා කරනු ලබන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට ඊට හැකිවන තත්ත්වයන් පවතින විටදී තීරණයකරනු ලැබේ. ක්ෂයවීමේ ක්‍රමවේද,

ඵලදායී ජීවිත කාලයන් සහ අවශේෂ අගයන් සෑම වාර්තා කරන දිනටම නැවත තක්සේරු කොට යෝග්‍ය නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

3.1.7 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ. අස්පෘශ්‍ය වත්කමක් මුලින්ම පිරිවැයට මණිනු ලැබේ. ව්‍යාපාරික සංයෝජනයක අත්කර ගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය අත්කර ගත් දිනට සාධාරණ වටිනාකම වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් යම් සමුච්චිත ක්‍රමක්ෂයක් සහ යම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකොට පිරිවැයට දක්වන ලැබේ. අභ්‍යන්තරව උත්පාදිත අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු නොලබන අතර ආශ්‍රිත වියදම, එම වියදම දැරූ වර්ෂයේ ලාභ හෝ අලාභවල පෙන්නුම් කරනු ලැබේ.

පරිමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්

පරිමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානි වී තිබීමට ඉඩ ඇති බවට හැඟවීමක් ඇති කවර හෝ විටදී හානිය සඳහා තක්සේරු කරනු ලැබේ. පරිමිත ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාලසීමාව සහ ක්‍රමක්ෂ ක්‍රමවේදය යටත් පිරිසෙයන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලයේ හෝ වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාවේ වෙනස්කම්, උචිත පරිදි ක්‍රමක්ෂ කාල සීමාව හෝ ක්‍රමවේදය වෙනස් කිරීම මගින් විස්තර කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස සලකනු ලැබේ. පරිමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂ වියදම, ආදායම් ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කමේ කර්තව්‍ය සමග සංගත වියදම් කාණ්ඩයෙහි හඳුනාගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාල පහත දැක්වෙන පරිදි වේ.

අයිතමය	**ප්‍රයෝජනවත් ජීවිත කාලය**
පරිගණක මෘදුකාංග	අවුරුදු 5
වෙබ් අඩවිය	අවුරුදු 5

හඳුනාගැනීම ඉවත්කිරීම

අස්පෘශ්‍ය වත්කමක් බැහර කිරිම මත හෝ එහි භාවිතයෙන් අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට එහි ධාරණ වටිනාකමේ හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කමක හඳුනාගැනිම ඉවත්කිරිම මගින් පැන නගින කිසියම් ලාභයක් හෝ අලාභයක් බැහැර කිරීමේ දිනට ශුද්ධ බැහැර කිරීම් උත්පාදන සහ වත්කමේ ධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලබන අතර වත්කමේ හඳුනා ගැනීම ඉවත් කරනු ලැබූ විටදී ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

3.2 ආයෝජන දේපළ

3.2.1 හඳුනාගැනීමේ සහ මැනීමේ පදනම

කුලී ආදායම ඉපැයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු ද්විත්වය වෙනුවෙන්ම දරා සිටින, එනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළදී විකිණීම සඳහා නොපවතින දේපළ ආයෝජන දේපළ වේ. මෙම දේපළ භාණ්ඩ හා සේවා නිපදවීම හෝ සැපයුම සඳහා හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

ආයෝජන දේපළ මුල් අවස්ථාවේ දි එහි පිරිවැයට හඳුනාගනු ලැබේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, ආයෝජන දේපළ එහි පිරිවැයට සඳහන් කරනු ලැබේ.

3.2.2 හඳුනාගැනීම ඉවත්කිරීම

ආයෝජන දේපළ බැහැර කරනු ලැබූ විටදී හෝ ආයෝජන දේපළ භාවිතයෙන් ස්ථිරවම ඉවත් කරනු ලැබ එය බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විටදී ඒවායේ හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. ආයෝජන දේපළක ඉවත් කිරීම හෝ බැහැර කිරීම මත යම් ලාභ හෝ අලාභ එසේ ඉවත් කරනු ලැබූ හෝ බැහැර කරනු ලැබූ වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

3.2.3 ආයෝජන දේපළට/ දේපළෙන් තදනන්තර පැවැරුම

හිමිකරු භුක්ති විඳීම අවසන් වීම, වෙනත් පාර්ශවයකට මෙහෙයුම් කල් බද්දක් ආරම්භ කිරීම හෝ ඉදි කිරීම හෝ සංවර්ධනය නිමා කිරීම මගින් සාක්ෂි දරන භාවිතයේ වෙනස්කමක් සිදු වන විටදීම පමණක් ආයෝජන දේපළට පැවැරුම් සිදු කරනු ලැබේ.

හිමිකරු භුක්ති විඳීම අවසන් වීම හෝ විකිණීමට අදහස් කර ගනිමින් සංවර්ධනය කිරීම ආරම්භ කිරීම මගින් සාක්ෂි දරන භාවිතයේ වෙනස්කමක් සිදු වන විටදීම පමණක් ආයෝජන දේපළට පැවැරුම් සිදු කරනු ලැබේ.

ආයෝජන දේපළකින් හිමිකරු පදිංචිගත දේපළකට හෝ තොගයකට පැවරුමක් සඳහා, පසුකාලීන ගිණුම්කරණය සඳහා දේපලේ හඟින පිරිවැය වනුයේ භාවිතයෙහි වෙනස්වීමක් සිදුවූ දිනයේ එහි සාධාරණ අගය වේ. හිමිකරු විසින් පදිංචිගත දේපළක් ආකාරයෙන් දේපළ සමාගම විසින් පරිහරණය කරන්නේ නම් එය ආයෝජන දේපළක් වන අතර, එහි භාවිතයේ වෙනසක් සිදුවන දිනය දක්වාම දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව එකී දේපළ සමාගම වගකිව යුතු වේ.

තොගයක් ආයෝජන දේපළක් බවට මාරු කිරීමේ දී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ. සමාගම විසින් ඉදි කරන ලද අයෝජන දේපළක ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම සමාගම විසින් නිමකරනු ලබන විටදී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

3.2.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම කිසියම් වත්කමක් හානි වීමේ ඇඟවීමක් ඇත්දැයි නිශ්චිතව දැන ගැනීම සඳහා සමාගම විසින් ඇස්මේන්තු කරනු ලැබේ. එවැනි හානිකරණ ඇඟවීම් පවතින විට හෝ වත්කම් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය විට භාර අරමුදල වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ආපසු අයකර ගහ හැකි අගය යනු වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් බෙහෙවින් පරිබාහිරව, එම වත්කම මුදල් ගලා ඒමක් සිදු නොකරන්නේ නම්. අදාළ වත්කමෙහි හෝ මුදල් ජනනය කරන ඒකකයෙහි, විකුණුමට වියදම් වන පිරිවැය සහ භාවිතයේ අගය අඩු කරන ලද සාධාරණ අගයයි. වත්කමක ධාරණ අගය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම හානිකරණය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්කමට විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩු කොට සාධාරණ වටිනාකම නිර්ණය කිරීමේදී , පවතින්නේ නම්, මෑත කාලීන වෙළඳපොළ ගනුදෙනු සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනු හඳුනාගත නොහැකි නම්, උචිත තක්සේරු කිරීමේ ආකෘතියක් භාවිතා කරනු ලැබේ.

3.3 පරිපාලිතයන්හි ආයෝජන හා අනෙකුත් ආයෝජන

පරිපාලිතයන්හි සිදුකරන ආයෝජන හා අනෙකුත් ආයෝජන මුල් අවස්ථාවේදී සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දී පිරිවැයක් ලෙස හඳුනා ගැනේ. පරිපාලිතයන් අත්පත් කරගැනීමට අදාළ යම් ගනුදෙනු පිරිවැයක් එම අවස්ථාවේදීම ආදායම් ප්‍රකාශනයේ හඳුනාගන්නා අතර, පරිපාලිතයන්හි සිදුකරන ආයෝජන මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව යම් සමුච්චිත හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු පිරිවැය මත දක්වනු ලැබේ.

3.4 විදේශ ව්‍යවහාර මුදල්

අ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

අදාළ අස්ථිත්වය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදල භාවිතා කොට මූල්‍ය ප්‍රකාශනවල අඩංගු අයිතම මනිනු ලැබේ. (කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල). සමාගමේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

ආ) ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ඒකකවලින් සිදුවන ගනුදෙනු, අදාළ ගනුදෙනු සිදුවන දිනයන්හි දී බල පැවැත්වෙන විනිමය අනුපාතිකයන් භාවිතයෙන් ව්‍යවහාරික මුදල් ඒකකය වෙත පරිවර්තනය කරනු ලැබේ. එවැනි ගනුදෙනු පියවීමේදී සහ විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් සිදුකරන මුදල් වත්කම් හා බැරකම් ගනුදෙනුවල දී ප්‍රතිඵල වන විදේශ විනිමය ලාභ සහ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. මුදල් වත්කම් හා බැරකම් ශේෂ වසර අවසාන විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කරනු ලැබේ.

3.5 බදුකරණය

3.5.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන හා පූර්ව කාල පරිච්ඡේද සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනු ලබන්නේ ආදායම් බදු කොමසාරිස්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් ප්‍රමාණ වශයෙනි. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගැනෙනුයේ වාර්තාකරණ දිනයට පෙර සිට බල පැවැත්වූ හෝ එම දිනයට බල පැවැත්වෙන පරිදි පනවා ඇති බදු අනුපාතික හා බදු නීති වේ.

මෙම භාර අරමුදල සඳහා ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම පහත පරිදි වේ.

අ) ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ආදායම් බදු සඳහා යටත් වන අතර අවසන් බද්ද ගණනය කරනු ලබන්නේ කාල සීමාව සඳහා ශුද්ධ ආදායම සහ අනුදත් වියදම ලෙස සලකනු ලබන සියලු වියදම් මත වන අතර අනතුරුව බදු ගණනය කිරීම මත අවසන් ආදායම නිර්ණය කිරීම සඳහා එළඹෙනු ලැබේ.

ආ) ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ආදායම් බදු පිළිබද අමාත්‍ය මණ්ඩල තීරණය

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - ප්‍රතිපත්තිමය කරුණු

1981 අංක 6 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතේ 12 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි තීරු බදු, ආනයන බදු ආදායම් බදු, තෑගි බදු සහ රඳවාගැනීමේ බදු ඇතුළුව සියලුම බදුවලින් නිදහස් වීම පිණිස 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 වැනි වගන්තියේ තුන්වන උපලේඛනයට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ඇතුලත් කිරීම සඳහා උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නව්‍යකරණ අමාත්‍යවරයා විසින් 31.12.2019 දිනැතිව ඉදිරිපත් කරන ලද සංදේශයක් වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/0144/215/010 - මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමන්ගේ නිරීක්ෂණ සමගින් ඉහත සංදේශය සලකා බලන ලදී. සාකච්ඡාවලින් පසුව, දල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග එක්ව සංදේශයේ දක්වා ඇති කාර්යය සඳහා මිළඟ අයවැයට යෝජනාවක් ඉදිරිපත් කිරීමේ හැකියාව විමසා බලන ලෙස උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නව්‍යකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියම කිරීමට සහ ඒ අනුව ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන ලදී.

3.5.2 විලම්බිත බදු

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත බදු සපයනු ලැබ ඇත්තේ, මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සහ බදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයන් සඳහා වත්කම් සහ බැරකම් අතර ධාරණ ප්‍රමාණවල තාවකාලික වෙනස්කම්වලට විධිවිධාන සලස්වමිනි.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් පිළිගනු ලැබේ.

සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම ප්‍රයෝජනයට ගත හැකි බදු අයකළ හැකි ලාභයක් තිබීමේ හැකියාව ඇති ප්‍රමාණයට සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම සඳහා විලම්භිත බදු වත්කම් පිළිගනු ලැබේ.

3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන දේ වලට අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු ලෙස රඳවාගෙන ඇති තැන්පතු ,මුලින් මාස තුනක කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඇතුලත් වේ .බැංකු අයිරා ශේෂ පත්‍රයේ ජංගම බැරකම් යටතේ පෙන්නුම් කරනු ලැබේ.

4. මූල්‍ය සාධනපත්‍ර - මූලික පිළිගැනීම සහ තදනන්තර මැණීම

4.1 මූල්‍ය වත්කම්

4.1.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මැනීම

2018 ජනවාරි 1 වනදා සිට ශ්‍රීලමූවාප්‍ර 9 ප්‍රකාරව, භාර අරමුදල වත්කම් කළමනාකරණය සඳහා ව්‍යාපාර ආකෘතිය මත පදනම්ව තම සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය කරන අතර වත්කමේ ගිවිසුම්කර නියමයන්;

- ක්‍රමක්ෂිත පිරිවැයට හෝ
- වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට (FVOCI) හෝ
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට (FVTPL) මනිනු ලැබේ.

මූල්‍ය වත්කම් තදනන්තරව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

4.1.2 ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්

ශ්‍රීලමූවාප්‍ර 9 ප්‍රකාරව, මූල්‍ය වත්කමක් පහත දැක්වෙන දෙයාකාර කොන්දේසි සපුරාලන්නේ නම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම ලෙස නිර්දිෂ්ඨ කර නොමැති නම්, ඒවා ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබයි.

- ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම පිණිස වත්කම් රඳවා ගැනීම අරමුණ වන්නා වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවා ගැනීම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්කර කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හිදී තනිකරම නොපියවා ඇති මුල් මුදල සහ එම මුල් මුදල මත පෙළිය ගෙවීම් වන මුදල් ප්‍රවාහ උද්ගත කරවීම

4.1.3 වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ වටිනාකමට මනින ලද මූල්‍ය වත්කම්

වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් වෙනත් විස්තීරණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද ණය සහ ස්කන්ධ සාධනපත්‍රවලින් සමන්විත වේ.

ශ්‍රීලමූවාප්‍ර 9 ප්‍රකාරව, මෙය වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ වටිනාකමට මනින ලද ණය සාධනපත්‍ර සහ වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ වටිනාකම අනුව නිර්දිෂ්ට කරන ලද ස්කන්ධ සාධනපත්‍රවලින් සමන්විත වේ.

4.1.4 වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට අනුව මනින ලද ණය සාධනපත්‍ර

මූල්‍ය වත්කමක් පහත දැක්වෙන දෙයාකාර කොන්දේසි සපුරාලන්නේ නම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය ලෙස නිර්දිෂ්ය කර නොමැති නම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය ලෙස නිර්දිෂ්ය කර නොමැති නම් පමණක් ණය සාධනපත්‍රයක් වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගය අනුව මනිනු ලබයි.

- ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම පිණිස වත්කම් රඳවා ගැනීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් අරමුණ සපුරා ගන්නා වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවා ගනු ලැබීම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්කර කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හිදී තනිකරම නොපියවා ඇති මුල් මුදල සහ එම මුල් මුදල මත පෙළිය ගෙවීම් වන මුදල් ප්‍රවාහ උද්ගත කරවීම

අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගනු ලබන සාධාරණ අගයේ වෙනස්කම් හේතුවෙන් පැන නගින ලාබ හෝ අලාබ සමගින් වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගය ණය සාධනපත්‍ර පසුව සාධාරණ අගයට මනිනු ලැබේ. පොලී ආදායස සහ අපේක්ෂිත ණය අලාභ සහ ප්‍රතිවර්තන ලාභ අලාභ තුල හඳුනා ගැනේ. පෙර වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනාගනු ලැබූ සමුච්චිත ලාභ හෝ අලාභ හඳුනාගැනීම් ඉවත් කිරීමේදී, වෙනත් විස්තීරණ ආදායම්වලින් ලාභ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කෙරේ. මීට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ විකිණීම සඳහා පවතින වශයෙන් වර්ගීකරණය කර තිබූ රජයේ සුරැකුම්පත්වලින් මෙම සාධනපත්‍ර සමන්විත වේ.

4.1.5 වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ සාධනපත්‍ර

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 32 හි " මූල්‍ය සාධනපත්‍ර ඉදිරිපත් කිරීම" යටතේ ස්කන්ධය යන්නෙහි අර්ථ දැක්වීමට අනුකූල වන සහ වෙළඳාම සඳහා රඳවා නොගත් ස්කන්ධ සාධනපත්‍රවලින් ක්‍රමෝපායික කාර්යය සඳහා රඳවාගත් ස්කන්ධ ආයෝජනවලින් කොටසක් මුල් හඳුනාගැනීමෙන් පසු, වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව ණය සාධනපත්‍ර ලෙස අවලංගු කර ගත නොහැකි පරිදි වර්ගීකරණය කිරීමට සමාගම විසින් ඇතැම් විට තීරණය කරනු ලැබේ. එවැනි වර්ගීකරණයක් සාධන පත්‍රයෙන් සාධන පත්‍රයට යන පදනම මත නිගමනය වේ.

මෙම ස්කන්ධ සාධනපත්‍රවල ලාභ සහ අලාභ කිසිදු විටක ලාභ හෝ අලාභ යටතට ප්‍රතිචක්‍රකරණය නොවන අතර, ඒ වෙනුවට එකී හඳුනාගැනීම් ඉවත් කරන අවස්ථාවේදී රඳවාගත් ඉපැයුම් වෙත සෘජුවම මාරු කෙරේ. ගෙවීම් වෙත අයිතිය ස්ථාපනය වූ පසු, ලාභාංශ ලාභ හෝ අලාභ ලෙස අනෙකතු මෙහෙයුම් ආදායම් යටතේ හඳුනා ගැනේ. වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වන ණය සාධනපත්‍ර හානිකරණ පරීක්ෂාවට භාජනය නොවේ.

මින් පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි "විකිණීම සඳහා පවතින" යටතේ වර්ගීකරණය වූ මිල සඳහන් නොකළ හිමිකම් කොටස්වලින් මෙම උපකරණ සමන්විත වේ.

4.1.6 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මනින ලද මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 අනුව, ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වර්ගීකරණය වූ මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්නම් ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීම සඳහා රඳවා ගත් හෝ කළමනාකරණය කරන හා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා දරා නොසිටින මෙන්ම මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම යන කාර්ය ද්විත්වය වෙනුවෙන්ම දරා නොසිටින බැවින් එහි කාර්යසාධනය සාධාරණ අගය මත පදනම්ව ඇගයීම සිදුවන මූල්‍ය වත්කම් ද සහ මුල් හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් ද ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 ප්‍රකාරව විකිණීම සඳහා රඳවා ගත් මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම්ය.

4.2 මූල්‍ය බැරකම්

4.2.1 මූල්‍ය බැරකම් වර්ගීකරණය හා පසුකාලීන මැනීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 අනුව, මූල්‍ය බැරකම් පහත ආකාරයෙන් වර්ගීකරණය කෙරේ.

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම්, සහ

- වෙළඳාම සඳහා රඳවාගත් හෝ
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද

වශයෙන් මෙම කාණ්ඩය තුළ වර්ගීකරණය වේ.

- ක්‍රමක්ෂය පිරිවැය අනුව මනින ලද මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකම්වල පසුකාලීන මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාරණ ප්‍රමිත (SLFRS 9) මගින් මූල්‍ය බැරකම් වර්ගීකරණය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 39) හි පවතින අවශ්‍යතා බොහෝ සෙයින් රඳවා ගෙන ඇත.

4.2.2 ලාභ හෝ අලාභ ඔස්සේ සාධරණ අගය අනුව මූල්‍ය බැරකම්

වෙළඳාම සඳහා රඳවා ගත් මූල්‍ය බැරකම් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මුල් හඳුනාගැනීමෙන් අනතුරුව නම් කරන ලද මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම් යටතට ඇතුළත් වේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් නොකරනු ලබ මූල්‍ය බැරකම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කෙරේ.

4.3 මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීම

4.3.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහය වෙත ගිවිසුම්කර අයිතීන් අවසන් වන විට හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සාරානුකූලව පවරනු ලබන ගනුදෙනුවකින් ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය එය

පවරනු ලබන විටදී හෝ නැතහොත් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සාරනුකූලව රඳවා ගැනීම පැවැරීම සමාගම සිදු නොකරන විටදී සහ මූල්‍ය වත්කමේ පාලනය එය රඳවා නොගන්නා විටදී සමාගම මූල්‍ය වත්කමක (හෝ අදාළ වන අවස්ථාවන්හිදී මූල්‍යමය වත්කමක කොටසක) හඳුනාගැනීම ඉවත් කරයි.

වත්කමෙහි ධාරණ අගය (හෝ වත්කමෙහි හඳුනාගැනීම ඉවත් කරන කොටසට අදාළ වන ධාරණ අගය) හා ලැබී ඇති ප්‍රතිශ්ඨාවල එකතුව (අලුතින් එක් කරගත් නව වත්කම්වලින් අලුතින් භාර ගන්නා බැරකම් අඩුකර එය ද ඇතුළුව) අතර වෙනස සහ වෙනත් විස්තීරණ ආදායම්හි දී හඳුනා ගන්නා යම් සමුච්චිත ලාභ/අලාභ, මූල්‍ය වත්කමක හඳුනා ගැනීම ඉවත් කිරීමේ දී ලාභ හෝ අලාභවලදී හඳුනා ගැනේ. එසේ වුවද, වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ස්කන්ධ ආයෝජන සුරැකුම්වලට අදාළව හඳුනාගත් සමුච්චිත ලාභ/අලාභ, ශ්‍රීලමූවාප්‍ර 9 ප්‍රකාරව හඳුනාගැනීම ඉවත් කිරීමේදී ලාභ හෝ අලාභවල හඳුනා ගනු නොලැබේ.

සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවා ගෙන සිටින, හඳුනාගැනීම ඉවත් කිරීම සඳහා සුදුසුකම් ලැබූ පැවැරූ මූල්‍ය වත්කමකට අදාළ කවර හෝ හිමිකමක් ඇතොත් එය වෙනම වත්කමක් හෝ බැරකමක් වශයෙන් හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගනු ලබන වත්කම් පැවැරීම සඳහා සමාගම ගනුදෙනුවලට එළඹීම සිදු කරන නමුත් පවරනු ලබන වත්කම් හෝ එහි කොටසක සියලු හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීම සිදු කරයි. එවැනි අවස්ථාවන්හි දි, පවරනු ලබන වත්කම්වල හඳුනා ගැනීම ඉවත් නොකරනු ලැබේ.

පවරනු ලබන වත්කම් මත සමගාමී මුළු අවදානම් අනුපාතිකය සහිතව වත්කම් තෙවන පාර්ශවයකට විකිණීමේදී, එය අලෙවි හා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවක් හා සමානව සුරැකුම් කරන ලද මූල්‍යමය ගනුදෙනුවක් ලෙස ගිණුම් ගත කෙරේ. එයට හේතුව වනුයේ සමාගම විසි් එකී වත්කම්වල හිමිකාරිත්වයේ සියලුම හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීමයි.

සමාගම විසින් වත්කමකින් මුදල් ප්‍රවාහයක් ලැබීමට ඇති සිය අයිතිය පැවැරූ විට හෝ පැවරිමේ විධිවිධානයකට එළඹී සිටීම සහ වත්කමක සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ පැවරීමක් හෝ රඳවා ගැනීමක් හො සිදුකර නොමැති හෝ වත්කම් පාලනය කිරීම පවරා නොමැති විටක, වත්කම සම්බන්ධයෙන් සමාගමේ අඛණ්ඩ සම්බන්ධතාවය පවතින සීමාව දක්වා එම වත්කම හඳුනා ගැනීම සිදු කෙරේ. එම අවස්ථාවේදී සමාගම විසින් ආශ්‍රිත බැරකම් හඳුනාගනු ලැබේ. සමාගම විසින් රඳවාගනු ලබන අයිතීන් හා බැඳීම් පිළිබිඹු වීමේ පදනම මත පැවැරූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මැනීම සිදු කරනු ලැබේ.

4.3.2 මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකමක ගිවිසුම්කර බැඳීම් ඉටු කළ විටදී හෝ අවලංගු කළ විටදී හෝ කල් ඉකුත් වූ විටදී සමාගම එහි හඳුනා ගැනිම ඉවත් කරයි.

4.3.3 මූල්‍ය සාධනපත්‍ර හිලව් කිරීම

හඳුනාගත් මුදල් ප්‍රමාණ හිලව් කිරිමට වත්මනෙහි බලාත්මක කළ හැකි නෛතික අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනමකින් බේරුම් කිරීමට අභිප්‍රායක් හෝ වත්කම් ලබා ගැනීමට සහ එකවර වගකීම් බේරුම් කිරීමට අභිප්‍රායක්

ඇත්නම් පමණක්ම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කොට ශුද්ධ මුදල මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ.

ආදායම් සහ වියදම් ශුද්ධ පදනම මත ඉදිරිපත් කෙරෙනුයේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මගින් අවසර ලැබෙන අවස්ථාවනිහිදි පමණක් හෝ සමාගමේ වෙළඳ කටයුතු වැනි සමාන ආකාරයේ ගනුදෙනු සමූහයකින් ප්‍රතිඵල වන ලාභ හා අලාභ සඳහා පමණි.

5. බැරකම් සහ ප්‍රතිපාදන

5.1 බැරකම්

5.1.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

5.1.1.1 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සියලුම සේවකයන් සඳහා පළමු වසරේ සිටම ක්‍රියාත්මක වන විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ. එසේ වුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පනත යටතේ්, සේවකයකු සඳහා වගකීමක් ඇති වනුයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් අනතුරුව වේ. මෙම වගකීම ගණනය කරනුයේ සෑම වර්ෂයක් සඳහා මාසයක වැටුපෙන් අර්ධයක අනුපාතිකය මත වේ. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ බැරකම් යටතේ දැක්වේ.

මෙම පාරිතෝෂික බැරකම් වෙනුවෙන් බාහිර ලෙස මුදල් යෙදවීමක් සිදු නොවේ.

5.1.1.2 නිර්වචිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

මහපොළ භාර අරමුදල විසින් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත දරණ දායකත්වයන් අදාළ නීති රීතිවලට අනුකූලව අදාළ දායකත්ව ප්‍රතිපාදන මගින් ආවරණය වේ. සේවකයක් ආවරණය කරමින් දායකත්ව සැලසුම් වෙත දායක මුදල් ගෙවීමට ඇති බැඳීම් ආදායම් ප්‍රකාශනයේ වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල

භාර අරමුදල හා සේවකයන් පිළිවෙළින් දළ වැටුපෙන් 15% සහ 10% ක් අර්ථසාධක අරමුදල දායක කරයි.

සේවක භාරකාර අරමුදල

භාරකාර අරමුදල සේවකයන්ගේ දළ වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායක කරයි.

5.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික සහ සම්මුතික බැඳීමක් භාර අරමුදල සතු විටදී එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. සමාගම විසින් ඇතැම් හෝ සියලු

ප්‍රතිපාදන ප්‍රතිපූරණය කිරීමක් අපේක්ෂා කරන විටදී, නිදසුනක් වශයෙන් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් යටතේ නම්, ප්‍රතිපූරණය වෙනම වත්කමක් යටතේ හඳුනාගන්නා අතර නමුත් එසේ කරනුයේ ප්‍රතිපූරණය සත්‍ය වශයෙන්ම ස්ථිර නම් පමණකි. කිසියම් ප්‍රතිපාදනයක් හා සබැඳි වියදම්, යම් ප්‍රතිපූරණයක් තිබේ නම් එය අඩු කොට විස්තිරණ ආදායම් ප්‍රකාශනයෙහි ඉදිරිපත් කරනු ලැබේ.

මුදලේ කාලික අගයේ බලපෑම ප්‍රමාණාත්මක නම්, බැරකම් සඳහා නිශ්චිත වන අවදානම් අදාළ පරිදි පෙන්නුම් කෙරෙන ප්‍රවර්තන පෙර බදු අනුපාතිකය භාවිතයෙන් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් කිරීම යොදා ගනු ලබන විට කාලය ගත වීමට අනුව සිදුවන ප්‍රතිපාදන වැඩිවීම මූල්‍ය පිරිවැයක් වශයෙන් හඳුනා ගැනේ.

6. ආදායම් හා වියදම්

6.1 ආදායම් හඳුනා ගැනීම

2018 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මගින්, ආදායම සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 (LKAS 18) හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 (LKAS 11) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ විවරණ කමිටුවේ පාරිභෝගික ලැදියාව සම්බන්ධ IFRIC 13 ද ඇතුළුව ආදායම් හඳුනා ගැනීම් මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කර ඇත..

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මගින් ආදයම හඳුනාගනු ලබන්නේ කෙසේද හා කොපමණ වශයෙන් කවර දිනයකට ද යන්න නිර්ණය කිරීම සඳහා සම්පූර්ණ ආකෘති රාමුවක් සපයනු ලැබේ. ආදායම හඳුනාගනු ලබන්නේ කවර දිනයකට ද හා කවර අගයකින් ද යන්න නිර්ණය කිරීම සඳහා අස්තිත්වය විසින් පියවර පහකින් යුතු ආකෘතියක් යොදා ගැනීම අවශ්‍ය වේ. ආදායම හඳුනා ගන්නේ කවර දිනයක ද හෝ අස්තිත්වය සඳහා අපේක්ෂා කරන හිමිකාරිත්වය යටතේ කුමන අගයකින් පාරිභෝගිකයා වෙත භාණ්ඩ හා සේවාවල පාලනය පවරා දීම යන්න සහ භාරකාර අරමුදල වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම අපෙක්ෂා කළ හැක්කේ කවර දිනයක දී යන්න හා ගෙවීම කරන දිනය කුමක් වුවද ආදායම හා දරණ ලද හෝ දැරිය යුතු ආශ්‍රිත වියදම් විශ්වසනීය ආකාරයකින් මිනුම්කරණය මෙම ආකෘතිය මගින් නිශ්චය කෙරේ. ගිවිසුම් ප්‍රකාරව නිර්වචිත ගෙවීම් නියම සැලකිල්ලට ගනිමින්, ලැබී ඇති හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවන්හි සාධාරණ අගයට ආදායම මනිනු ලැබේ.

6.1.1 පොළී ආදායම

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන සියලු මූල්‍ය සාධනපත්‍ර සහ විකිණීම සඳහා පවතින ලෙස වර්ගීකරණය කරන ලද පොළී දරන මූල්‍ය වත්කම් සඳහා පොළී ආදායම හෝ වියදම් සඵල පොළී අනුපාතිකය භාවිතා කරමින් වාර්තා කරනු ලැබේ. සඵල පොළී අනුපාතිකය යනු මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ ධාරණ අගයට මූල්‍ය උපකරණවල අපේක්ෂිත ජීව කාල හෝ කෙටි කාල සීමාවක් ඔස්සේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම හෝ ලැබීම අනුව තත්ත්වාකාරයෙන් වට්ටම් කරනු ලැබූ අනුපාතිකයයි. ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම තුළ පොළී ආදායම ඇතුළත් වේ.

6.1.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනමක් යටතේ හඳුනා ගැනේ.

6.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමට වැය කෙරෙන සියලු වියදම් වසර සඳහා ලාභය ගණනය කිරීමේ දී ආදායමෙන් අයකරනු ලැබේ. අලුත් වැඩියා කිරීම් හා අලුත් කිරීම්වලට අදාළ වියදම් දරනු ලැබූ වර්ෂයට අදාළ ලාභ හා අලාභවලින් අය කරනු ලැබේ.

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා		**2023**	**2022**
7 ආදායම			
ශුද්ධ පොලී ආදායම	**7.1**	2,461,392,279	1,771,795,864
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයේ කොටස		1,518,870,570	1,381,768,390
SLIIT වෙතින් ලද කල්බදු කුලිය		25,000,000	25,000,000
		4,005,262,849	**3,178,564,254**

7.1 ම.හා.අ. - අයෝජන ආදායම			
භාණ්ඩාගාර බැඳුම්කර		614,345,175	726,704,479
භාණ්ඩාගාර බැඳුම්කර - ආධිකාෂය අඩු කොට ප්‍රාග්ධන ලාභ		-	-
භාණ්ඩාගාර බිල්පත් - පොලී	**සටහන 7.2**	1,513,713,588	628,929,539
ණයකර පොලී		9,679,694	110,793,893
රඳවාගැනීමේ බද්ද අඩුකොට ස්ථාවර තැන්පතු		258,075,240	272,130,181
REPO ආදායම		35,688,360	5,439,284
කෙටිකාලීන ආදායම		29,316,072	27,418,223
ස්විපර් ආදායම		574,150	380,263
		2,461,392,279	**1,771,795,862**

7.2 භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම		
වසර තුළ ලැබුණු පොලිය	1,537,483,374	60,687,700
ලැබිය යුතු පොලිය	118,194,306	659,965,785
මුළු පොලී ආදායම	**1,655,677,680**	**720,653,485**
අඩුකළා		
NWSL භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම	(141,964,092)	(91,723,946)
ම.හා. භාණ්ඩාගාර බිල්පත් අරමුදලේ පොලී ආදායම	**1,513,713,588**	**628,929,539**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා		2023	2022
8 සෘජු වියදම්			
ශිෂ්‍යත්ව ගෙවීම්			
ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල	**(සටහන 8.1)**	1,540,063,200	1,288,347,209
ශිෂ්‍යත්ව ගෙවීම් -තාක්ෂණ විද්‍යාල		53,377,100	59,930,000
ශිෂ්‍යත්ව ගෙවීම් - අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන		5,612,742	17,866,350
නව ශිෂ්‍යත්ව ප්‍රදාන වියදම්		1,352,952	406,276
		1,600,405,994	**1,366,549,835**
8.1 ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල			
ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල		3,016,756,600	2,677,047,059
අඩුකළා : භාණ්ඩාගාර දායකත්වය (ප්‍රතිපාදන කොමිසම හරහා)		(1,476,693,400)	(1,388,699,850)
		1,540,063,200	**1,288,347,209**
9 වෙනත් ආදායම්			
කාර්ය මණ්ඩල ණය පොලී		81,011	65,065
පරිත්‍යාග		1,860,039	-
ශිෂ්‍යත්ව අඩු කිරීම		39,990	98,350
විවිධ ආදායම්		4,000	38,000
වෙනත් ආදායම		-	143,735
පාරිතෝෂික ස්ථාවර තැන්පතු ආදායම		236,444	127,649
		2,221,485	**472,798**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023	2022
10 පරිපාලන වියදම්		
වැටුප්	12,435,021	12,871,814
පැමිණීම සහ සන්නිවේදන දීමනාව	1,516,177	1,566,500
අතිකාල සහ සති අන්ත ගෙවීම්	93,303	245,314
සේ.අ.අ.	1,525,058	1,471,291
සේ.භා.අ.	304,756	297,693
ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් හා කාර්ය මණ්ඩල දිරි දීමනා	-	411,081
ක්ෂය කිරීම	30,482,761	31,052,906
ක්‍රමක්ෂය	247,061	247,061
තැපැල් ගාස්තු සහ සන්නිවේදනය	32,570	37,615
සුභසාධන වියදම්	362,346	238,972
දුරකථන	561,066	647,612
විගණන ගාස්තු	476,100	396,000
පරිවර්තන සහ වෙනත් සේවා ගාස්තු	36,140	122,765
භාරකාර මණ්ඩල සහ ආයෝජන රැස්වීම් ගාස්තු	255,000	275,000
ඉන්ධන, ගමන් කිරීම සහ යැපීම	456,011	467,157
ජල	65,600	36,320
විදුලිබල	372,043	534,232
පිරිසිදු කිරීමේ වියදම්	18,000	51,400
සංග්‍රහ වියදම්	42,120	47,881
ආරක්ෂක ගාස්තු	-	4,320
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	910,791	784,815
නඩත්තු වියදම් - කාර්යාල උපකරණ	84,325	1,674,382
කාර්යාල කුලිය	3,063,610	3,623,400
පද්ධති නඩත්තු සහ තොරතුරු තාක්ෂණ වියදම්	172,038	210,288
පරිත්‍යාග- ලලිත් ඇතුලත්මුදල පදනම	1,500,000	1,775,000
රක්ෂණ - කාර්ය මණ්ඩල	400,000	325,000
වෙළඳ දැන්වීම් වියදම්	-	663,093
නීති ගාස්තු	450,834	469,359
දායක ගාස්තු	43,091	83,060
විවිධ වියදම්	47,019	64,700
වාහන කල්බදු කුලිය	-	1,262,283
වාහන කුලිය	300,000	
වාහන නඩත්තුව	2,667,067	939,314
භාරකාර ගාස්තු -ලංකා බැංකු ආයෝජන බැංකුකරණය	707,692	2,689,692
වෘත්තීය ගාස්තු	80,220	187,484
සෞඛ්‍ය සේවා සහ ආරක්ෂිත වියදම්	-	25,140
විදුලි උත්පාදකය සවිකිරේ වියදම	193,204	
කාර්යාලය වෙනත් ස්ථානයකට රැගෙන යාමේ වියදම	4,010,938	-
විගණන හා කළමනාකරණ කමිටු සාමාජික ගාසතුව	45,000	-
	63,956,962	**65,799,943**
11 මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	85,930	71,020
	85,930	**71,020**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

12 දේපළ, පිරියත හා උපකරණ

(2023.12.31 දිනට වර්ගීකරණ වෙනස්වීම)

දළ ධාරණ මුදල් ප්‍රමාණය	**2023.01.01 දිනට ශේෂය**	**එකතු කිරීම්**	**බැහැර කිරීම්**	**2023.12.31 දිනට ශේෂය**
ගෘහ භාණ්ඩ සහ සවිකුරු	8,483,312	-	-	8,483,312
කාර්යාල උපකරණ	3,898,935	11,450	-	3,908,635
පරිගණක හා උපාංග	7,318,830	-	-	7,328,330
මෝටර් වාහන	16,190,000	-	-	16,190,000
ක්ෂය කළ හැකි වත්කම්වල මුළු වටිනාකම	**35,891,077**	**11,450**	**-**	**35,910,277**

සමුච්චිත ක්ෂයකිරීම හා හානිකරණය	**2023.01.01 දිනට ශේෂය**	**වර්ෂය සඳහා අයකිරීම**	**බැහැර කිරීම්**	**2023.12.31 දිනට ශේෂය**
ගෘහ භාණ්ඩ සහ සවිකුරු	8,091,405	92,025	-	8,183,430
කාර්යාල උපකරණ	2,379,490	520,852	-	2,900,341
පරිගණක හා උපාංග	7,255,510	18,867	-	7,274,377
මෝටර් වාහන	12,082,619	3,238,000	-	15,320,619
මුළු ක්ෂයකිරීම	**29,809,025**	**3,869,744**	**-**	**33,678,767**

ශුද්ධ පොත් වටිනාකම	**2023**	**2022**
ගෘහ භාණ්ඩ සහ සවිකුරු	299,882	391,907
කාර්යාල උපකරණ	1,008,294	1,519,445
පරිගණක හා උපාංග	53,953	63,320
මෝටර් වාහන	869,381	4,107,381
දේපළ, පිරියත හා උපකරණවල මුළු ධාරණ වටිනාකම	**2,231,510**	**6,082,052**

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

13 අස්පෘශ්‍ය වත්කම්

දළ ධාරණ මුදල් ප්‍රමාණ	2023.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	බැහැර කිරීම්	2023.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	177,000	-	-	177,000
මහපොළ වෙබ් අඩවිය	775,000	-	-	775,000
MS Office -2019	283,306	-	-	283,306
ක්ෂය කළ හැකි වත්කම්වල මුළු වටිනාකම	**1,235,306**	**-**	**-**	**1,235,306**

සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණය	2023.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම	බැහැර කිරීම්	2023.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	141,018	35,400	-	176,418
මහපොළ වෙබ් අඩවිය	585,602	155,000	-	740,602
MS Office -2019	86,466	56,661	-	143,127
මුළු ක්ෂයවීම	**813,086**	**247,061**	**-**	**1,060,147**

ශුද්ධ පොත් අගයන්	2023	2022
පරිගණක මෘදුකාංග	582	71,382
මහපොළ වෙබ් අඩවිය	34,398	344,398
MS Office -2019	140,179	253,501
අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ වටිනාකම	**175,159**	**669,280**

14 ආයෝජන දේපල

(2023.12.31 දිනට වර්ගීකරණ වෙනස්වීම)		2023	2022
සින්නක්කර ඉඩම (මාලබේ - SLIIT වෙත බදු දී ඇත)	සටහන	12,460,179	12,460,179
බදුකරඉඩම (මිල්ලෑව)		340,200,000	340,200,000
ගොඩනැගිලි (මාලබේ - SLIIT)	සටහන	778,250,940	804,863,958
		1,130,911,119	**1,157,524,137**

දළ ධාරණ මුදල් ප්‍රමාණ	2023.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	බැහැර කිරීම්	2023.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	1,064,520,695	-	-	1,064,520,695
	1,064,520,695	**-**	**-**	**1,064,520,695**

සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණය	2023.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම	බැහැර කිරීම්	2023.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	259,656,737	26,613,017	-	286,269,755
	259,656,737	**26,613,017**	**-**	**286,269,755**

සටහන: මාලබේ පිහිටි මෙම ඉඩම සීමාසහිත ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ගැරන්ටි ආයතනයට බදු දී ඇත .

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා		2023	2022
15 පරිපාලිත සමාගම්වල ආයෝජනය			
නැෂනල් වෙල්ත් සමාගම *		985,000,000	985,000,000
		985,000,000	**985,000,000**

* නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස පිහිටුවා ඇත

		2023	2022
16 වෙනත් වෙනත් ආයෝජන			
සංවර්ධ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රාග්ධන ආයෝජනය		2,200,000	2,200,000
		2,200,000	**2,200,000**
17 මූල්‍ය වත්කම් (2023.12.31 දිනට ප්‍රතිවර්ගීකරණය කරන ලද)			
FVTOCI හි මූල්‍ය වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර	**සටහන**	3,456,285,195	6,208,728,828
භාණ්ඩාගාර බැඳුම්කර වාරික සහ වට්ටම්		-	-
මූල්‍ය වත්කම් ප්‍රතික්ෂේප කළ පිරිවැයට			
භාණ්ඩාගාර බිල්පත්		10,119,787,100	5,336,408,950
ණයකර		-	375,000,000
ස්ථාවර තැන්පතු		1,900,000,000	500,000,000
FVPL මූල්‍ය වත්කම්			
REPO		1,355,000,000	-
		16,831,072,295	**12,420,137,778**
17.1 භාණ්ඩාගාර බැඳුම්කර			
ජනවාරි 31 දිනට ශේෂය		6,208,728,828	**7,992,639,179**
වසර තුළ එකතු කිරීම්		-	477,536,000
වසර තුළ හඳුනාගත් පොලිය		614,345,175	726,704,479
වසර තුළ භාණ්ඩ මිලදී ගැනීම හා විකිණීම			(517,417,000)
ලැබුණු කූපන		(750,651,723)	(795,550,286)
පෙර වසර තුළ විකුණන ලද භාණ්ඩාගාර බිල්පත් සඳහා ගැලපුම්		(4,025,608,811)	(56,886,902)
		2,046,813,469	**7,827,025,470**
විකුණන ලද භාණ්ඩාගාර බිල්පත් සඳහා ගැලපුම		-	(2,661,815)
වසර තුළ සාධාරණ වටිනාකම් වෙනස්වීම්		1,409,471,726	(1,615,634,827)
ණය සාධනපත්‍ර සාධරණ තක්සේරුව මත ශුද්ධ ලාභ/අලාභ		**1,409,471,726**	**(1,618,296,642)**
දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය		**3,456,285,195**	**6,208,728,828**
18 වෙනත් වත්කම්			
විශ්‍රාම ප්‍රතිලාභ වත්කම් (ස්ථාවර තැන්පතු)		5,271,807	-
ලිපි ද්‍රව්‍ය තොගය		183,747	304,761
කුලී තැන්පතු ජයවර්ධන මධ්‍යස්ථානය		1,811,700	1,811,700
සතොස කුලී තැන්පතු		348,810	348,810
		7,616,064	**2,465,271**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023	2022
19 අත්තිකාරම් සහ පෙරගෙවුම්		
කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	1,692,954	1,845,504
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	330,000	306,000
වෛද්‍ය රක්ෂණය පෙරගෙවුම	61,858	61,858
උත්සව අත්තිකාරම්	-	-
විදුලි උත්පාදකය සඳහා පෙර ගෙවුම	-	193,204
	2,084,812	**2,406,567**
20 අනෙකුත් ලැබිය යුතු දෑ		
වි.ප්‍ර.කො.සභාවෙන් ලැබිය යුතු මුදල් (භාණ්ඩාගාර දායක මුදල)	505,498,250	429,337,500
වි.ප්‍ර.කො.සභාවෙන් ලැබිය යුතු මුදල් (භාණ්ඩාගාර දායකත්වය)	649,549,209	266,790,550
ස.ලො.මණ්ඩලයේ ලාභ කොටස් ලැබිය යුතු මුදල්	197,424,658	62,089,041
භාණ්ඩාගාර බැඳුම්කර කූපන් ලැබිය යුතු දේ		-
ණයකර පොලී ලැබිය යුතු දේ	-	24,854,075.34
පාරිතෝෂික ස්ථාවර තැන්පතු පොලී ලැබිය යුතු මුදල්	758,121	71,194
භාණ්ඩාගාර බිල්පත් පොලී ලැබිය යුතු දෑ - ම.භා.අ.	118,194,306	568,241,839
භාණ්ඩාගාර බිල්පත් පොලී ලැබිය යුතු දෑ - NWSL	-	91,723,946
ලැබිය යුතු REPO ආදායම	1,288,592	-
ශිෂ්‍යත්ව ගෙවීම් ලැබිය යුතු මුදල්	25,000	25,000
මහපොළ වෙළඳ ප්‍රදර්ශන ලැබිය යුතු	83,761,479	-
ලැබිය යුතු මුදල් -වෙළඳ අමාත්‍යාංශය	1,021,450	1,021,450
	1,557,521,065	**1,444,154,595**
වාහන රක්ෂණ ලැබිය යුතු මුදල්	40,038	40,038
ලැබිය යුතු රක්ෂණ වාරික	22,427	11,795
	1,557,583,531	**1,444,206,429**
21 මුදල් සහ මුදල් සමාන දෑ (2023.12.31 දිනට නැවත වර්ගීකරණය කරන ලද		
ලංකා බැංකුව - ජංගම ගිණුම -83302834	705,029	494,609
ලංකා බැංකුව - ජංගම ගිණුම -83867162	196,802	51,281
සුළු මුදල් සහ අනෙකුත් මුදල් අත්තිකාරම්	25,000	-
ලංකා බැංකුව -එක් දින කල්පිරීම් ආයෝජන	38,000,000	64,200,000
ලංකා බැංකුව- ස්වීපර් ගිණුම -4079	1,190,084	1,328,206
	40,116,915	**66,074,097**
22 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම		
ජනවාරි 01 දිනට ශේෂය	**5,271,808**	**4,905,475**
පාරිතෝෂික ස්ථාවර තැන්පතු පොලී ආදායම	450,483	366,333
ලාභ හෝ අලාභවල හඳුනාගත් වියදම්	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**5,722,290**	**5,271,808**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023	2022
23 උපචිත සහ අනෙකුත් ගෙවීම්		
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - විශ්වවිද්‍යාල	718,425,000	494,332,300
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - කාර්මික විද්‍යාල	-	10,487,500
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - උසස් අධ්‍යාපන ආයතන	-	10,647,800
රඳවා ගැනීමේ ගිණුම	1,547,409	1,547,409
රඳවා ගැනීමේ ගිණුම ශාන්ත ආනා විද්‍යාලය	382,417	382,417
රඳවා තබා ගැනීම ගිණුම ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාලය	243,503	243,503
රැඳවුම් ඇඹිලිපිටිය පිහිනුම් තටාකයේ වියදම්	585,449	585,449
	721,183,777	**518,226,378**
ගෙවිය යුතු විගණන ගාස්තු	824,100	348,000
ගෙවිය යුතු වි.ප්‍ර.කො.ස. ප්‍රදාන	68,600	68,600
Slip Return - විශ්වවිද්‍යාල	3,777,153	2,492,903
Slip Return - උසස තාක්ෂණික ආයතන	3,082,500	2,070,000
Slip Return -උසස් අධ්‍යාපන ආයතන	282,150	139,350
දුරකථන බිල්පත	41,449	52,591
අතිකාල සඳහා ගෙවිය යුතු මුදල්	46,446	1,238
පැමිණීමේ දීමනාව සඳහා ගෙවිය යුතු මුදල්	113,000	130,000
වැටුප් සඳහා ගෙවිය යුතු	-	78,000
පාසල් සංවර්ධන කටයුතු	1,074,097	1,074,097
ගෙවිය යුතු වෘත්තීය ගාස්තු	10,000	-
ගෙවිය යුතු මුද්‍රණ හා ඡායා පිටපත් ගාස්තු	93,927	-
ලබා නොගත් නිවාඩු සඳහා ගෙවිය යුතු	-	411,081
ගෙවිය යුතු ශිෂ්‍යත්ව ගෙවීම	29,800	29,800
ගෙවිය යුතු භාරකාර ගාස්තු	-	235,897
ගොඩනැගිලි කුලිය සඳහා ප්‍රතිපාදනය	-	1,207,800
ගෙවිය යුතු සේ.අ.අ.	2,804	-
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	50,000	-
	9,496,027	**8,339,356**
	730,679,804	**526,578,821**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් -ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023	2022
24.0 NWSL ජංගම ගිණුම		
2023.01.01 දිනට ශේෂය		-
2023.01.01 දිනට වර්ගීකරණ වෙනස්කම්		
මහපොළ භාර අරමුදලේ NWSL අරමුදල් ආයෝජනය	850,000,000	
2022දී හඳුනාගත් ආයෝජන ආදායම	126,500,344	
NWSL වෙතින් වත්කම් පැවරුම	148,950	
NWSL සඳහා දරන ලද වියදම්	(400,324,745)	576,324,549
2023.01.01 දිනට වර්ගීකරණ ශේෂය		576,324,549
ආයෝජනවලින් අරමුදල් වෙන්කිරීම්		
2023 දී හඳුනාගත් ආයෝජන ආදායම	(141,964,092)	
කාලසීමාව තුළ NWSL වෙත පවරන ලද අරමුදල්	38,019,172	(103,944,920)
2023.12.31 දිනට අවසන් ශේෂය		**680,269,469**
25 බැංකු අයිරාව (2023.12.31 දිනට වර්ගීකරණ වෙනස)		
ලංකා බැංකුව- ජංගම ගිණුම	758,170.23	159,325
	758,170	**159,325**

26 ප්‍රාග්ධන හා අනෙකුත් බැඳීම්

2023 ජුනි 30 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රමාණාත්මක ප්‍රාග්ධන වියදම් හෝ වෙනත් මූල්‍ය කැපවීම් කිසිවක් නොතිබුණි.

27 වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනය වූ ජුනි 30 සහ බලය පැවැරූ දිනය අතර මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් හෝ අනාවරණ සිදුකිරීමට අවශ්‍ය වන්නා වූ සිදුවීම් නොතිබුණි .

28 අනිශ්චිත වගකීම්

ජුනි 30 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් /හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය ප්‍රමාණාත්මක අනිශ්චිත වගකීම් කිසිවක් නොතිබුණි.

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

27 සම්බන්ධිත පාර්ශව අනාවරණ

අරමුදල් පැවරුම භාර අරමුදල ආශ්‍රිත පාර්ශවයන්ට අදාළ ආයතන සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇතුළත් වේ.

සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු

සාමාන්‍ය වාණිජ නියමයන් යටතේ 2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළ පහත ගනුදෙනු අදාළ පාර්ශ්ව සමහ සිදු කර ඇත.

සමාගමේ / ආයතනයේ නම	සබඳතාවය	ගනුදෙනුවල ස්වභාවය	ගනුදෙනුවේ වටිනාකම	ලැබිය යුතු/ගෙවිය යුතු මුදල
සංවර්ධන ලොතරැයි මණ්ඩලය	සාමාන්‍ය අධ්‍යක්ෂ	ලාභ කොටස	1,518,870,570	648,700,000
නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම		ආයෝජනවලින් ලැබුණු ආදායම	64,477,554	(64,477,554)
		ආයෝජනවලින් ලැබුණු ආදායම	77,486,538	(77,486,538)
		NWSL වෙත අරමුදල් පැවරුම	38,019,172	38,019,172

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

28 මූල්‍ය සාධනපත්‍ර හා අවදානම් කළමනාකරණය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වාර්තාකර ඇති එක් එක් කාණ්ඩයේ මූල්‍ය සාධනපත්‍රවල ගිණුම්කරණ වර්ගීකරණය සහ ඒවායේ ධාරණ වටිනාකම පහත දක්වා ඇත.

මූල්‍ය වත්කම් හා බැරකම්වල ධාරණ වටිනාකම	සටහන	**2023**	**2022**
වෙනත් විස්තීරණ ආදායම හරහා සාධාරණ වටිනාකම මූල්‍ය වත්කම්			
	17	**3,456,285,195**	**6,208,728,828**
ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම මූල්‍ය වත්කම්			
REPO	**17**	1,355,000,000	-
		1,355,000,000	-
ක්‍රමක්ෂිත පිරිවැය			
භාණ්ඩාගාර බිල්පත්	**17**	10,119,787,100	5,336,408,950
ණයකර	**17**	-	375,000,000
ස්ථාවර තැන්පතු	**17**	1,900,000,000	500,000,000
වෙනත් ලැබිය යුතු දෑ	**20**	1,557,521,065	1,444,154,595
මුදල් හා මුදල් සමාන දෑ	**21**	40,116,915	66,074,097
		13,617,425,080	**7,721,637,642**

ආයතනික ණය එලදායි පොලි අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂිප්ත පිරිවැයක් යටතේ ප්‍රකාශ කර ඇති අතර , ක්‍රමක්ෂ කළ පිරිවැය යටතේ නම් කරන ලද අනෙකුත් මූල්‍ය වත්කම්වල ධාරණ අගය සාධාරණ වටිනාකමට ආසන්න වන බැවින් ධාරණ අගයෙන් ප්‍රකාශ කරනු ලැබේ.

මූල්‍ය බැරකම්

වෙනත් මූල්‍ය බැරකම්			
වෙනත් ගෙවිය යුතු දෑ	**23**	**660,717,128**	**518,226,378**

සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් මූල්‍ය බැරකම් ක්‍රමක්ෂිත පිරිවැයට ප්‍රකාශ කර තිබේ .

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති වාර්තාව

මගේ අංකය எனது இல. My No.	පීඑස්/ ඊ/ එම්ටීඑෆ්/ එෆ් එස්/2023 /08	ඔබේ අංකය உமது இல. Your No.	
දිනය திகதி Date	2024 සැප්තැම්බර් 10 දින		

සභාපති
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාචනය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාචනය සඳහා පදනම

(අ) අරමුදල විසින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) වෙත බදු පදනම යටතේ ලබා දී තිබුණු දේපල වෙනුවෙන් 2022 මැයි 15 දින සිට 2023 මැයි 14 දින දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ලද රු. 25,000,000 ක් වූ සමාලෝචිත වර්ෂයේ බදු කුලිය බදුකුලී ආදායම ලෙස ගිණුම් ගතකර තිබුණු අතර, 2023 මැයි 15 දින සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ රු. 15,865,365ක් වූ බදුකුලී ආදායම ලැබිය යුතු බදු කුලී වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. ඒ හේතුවෙන් රඳවාගත් ඉපයීම් සහ ලැබිය යුතු බදු කුලී ආදායම රු. 15,865,365 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අරමුදල විසින් 2022 සහ 2023 වර්ෂයන්හි අවස්ථා 03 කදී මිලදී ගෙන තිබූ එකතුව රු. 953,311,962 ක භාණ්ඩාගාර බිල්පත්වලට අදාල රු 111,636,223 ක පොලි ආදායමක් අරමුදලේ පොලි ආදායමෙන් අඩුකර අරමුදලේ පරිපාලිත සමාගමක් වන සී/ස නැට්වෙල්ත් සෙකියුරිටිස් සමාගමට හිමි අගයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. කෙසේ වුවද, එම භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය සහ පොලි ආදායම සත්‍ය වශයෙන්ම එම සමාගමට අයත්ද යන්න පිළිබඳ විගණනයේදී තහවුරු නොවිය.

(ඇ) අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව ආයෝජන දේපල මුලික හඳුනාගැනිමෙන් පසු එහි පිරිවැයට ගිණුම්ගත කල යුතු වුවද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) වෙත බදු පදනම යටතේ ලබා දී ඇති ගොඩනැගිල්ලේ වටිනාකම ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු. 1,064,520,695 ක් දක්වා තිබුණ ද එම වටිනාකම පිරිවැය නොව ගණනය කරන ලද අගයක් වූ අතර, එම ගණනය කිරීමෙහි නිරවද්‍යතාවය සහ සමාලෝචිත වර්ෂය සඳහා එකී ගොඩනැගිල්ලේ ක්ෂය වටිනාකම වූ රු. 26,613,017 හි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු නොවීය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍යාධාර ගෙවීම් වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 1,600,405,994 තුළ 2022 වර්ෂයේ හිඟ ශිෂ්‍යාධාර වාරික වශයෙන් ගෙවන ලද රු. 207,779,900 ක් ඇතුළත් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍යාධාර වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද, රඳවාගත් ඉපයීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ජාඇල නගර සභා ක්‍රීඩාංගනයේ පවත්වන ලද මහපොළ වෙළෙඳ ප්‍රදර්ශනය සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් ගිණුම අනුව වෙළෙඳ ප්‍රදර්ශනය පැවැත්වීමෙන් ලද ආදායම රු. 97,827,611ක් ද සමස්ත වියදම රු. 126,874,496ක් ද වී තිබුණි. කෙසේ වුවද එම ආදායම් සහ වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් සහ වියදම් වශයෙන්

හඳුනාගෙන නොතිබුණි. තවද මහපොළ වෙළෙඳ ප්‍රදර්ශනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් රු. 39,243,733ක් ද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත්කර නොතිබුණි.

(ඊ) පහත සදහන් අයිතම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ විගණනයේ ගණනය කිරීම් අනුව ශේෂය අතර වෙනස්කම් පැවතුණි.

අයිතමය	මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	විගණනයේ ගණනය කිරීම් අනුව ශේෂය	වෙනස
(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබිය යුතු මුදල	505,498,250	582,333,050	76,834,800
(ii) ස්ථාවර තැන්පතු පොලිය	258,311,684	249,284,547	9,027,137
(iii) ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය	198,182,779	188,633,965	9,548,814

(උ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රඳවාගත් ඉපයුම් ශේෂය රු. 9,371,806,295 ක් වූවද ලෙජර් ගිණුම් අනුව එම ශේෂය රු. 9,288,046,893 ක් වූයෙන් රු. 83,759,401 ක වෙනසක් පැවතුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර 2ක වටිනාකම රු. 200,273,000 ක් වුවද බැංකුවෙන් ලද ගනුදෙනු සටහන් (Deal Note) අනුව ඒවායේ මුහුණත අගයන්හි (Face Value) එකතුව රු. 377,273,000 ක් වූයෙන් රු. 177,000,000 ක වෙනසක් පැවතුණි.

(එ) අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගම් දෙකක් වන සී/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා සී/ස නැට්වෙල්ත් සෙකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) ඉකුත් වර්ෂවලදී ක්‍රියාත්මක වූ මහපොළ මංගත ලොතරැයිය අවලංගු කිරීම සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බේරුම්කරණ ක්‍රියාවලිය පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය . මේ හේතුවෙන්,

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා අරමුදල තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ (එ) හා (ඒ) මඟින් දක්වා ඇති නිරීක්ෂණයන් හැර මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ)	2019 ජනවාරි 29 දිනැති අංක 02/2019 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 05 වන වගන්තිය	මාසික ශිෂ්‍යත්ව ගෙවීම් ලේඛණ ඉකුත් මාසයේ 30 වන දින වන විට උසස් අධ්‍යාපන ආයතන වෙත යොමු කල යුතු වුවද, 2023 ජූලි, සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 62ක් දී අරමුදල විසින් එම ලේඛන උසස් අධ්‍යාපන ආයතන 21ක් වෙත යොමු කිරීම දින 67 සිට දින 119 දක්වා කාල ප්‍රමාදයක් සහිතව සිදු කර තිබුණි තවද මහපොළ උසස් අධ්‍යාපන මාසික ශිෂ්‍යත්ව වාරිකය අදාල මාසයේ 15 වන දින වන විට ශිෂ්‍යත්වලාභීන්ගේ බැංකු ගිණුම් වෙත බැරකල යුතු වුවද, 2023 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අවස්ථා 10ක් දී මාසික ශිෂ්‍යත්ව වාරික ගෙවීම දින 63 සිට 126 ක් දක්වා කාල ප්‍රමාදයන් සහිතව සිදු කර තිබුණි.
(ආ)	2022 අංක 1 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් (සංශෝධන) පනත මඟින් සංශෝධිත 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 03 වන වගන්තියේ 2 (ආ) උපවගන්තිය	අරමුදලේ භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු, ජනාධිපතිවරයා විසින් අවුරුදු තුනක කාල සීමාවක් සඳහා පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකු හෝ විශ්‍රාමික විගණකාධිපතිවරයෙකු අරමුදලෙහි භාරකාර මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කළ යුතු වුවද 2023 ජූලි මස 03 දින සිට මෙම වාර්තාවේ දිනය දක්වා අරමුදලේ භාරකාර මණ්ඩලයෙහි සභාපති ධූරය පුරප්පාඩුව පැවතුනි.

(ඇ)	මූල්‍ය රෙගුලාසි 756(6)	සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් පැවැත් වූ බවට සමීක්ෂණ මණ්ඩලය විසින් අත්සන් කරන ලද විධිමත් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවක් 2024 අගෝස්තු 22 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 **වෙනත් කරුණු**

(අ) අරමුදල වෙනුවෙන් මාර්ගගත ලොතරැයියක් ආරම්භ කිරීම සඳහා 2021 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර, තෝරාගත් ආයෝජක ආයතනය වෙත එම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා 2023 පෙබරවාරි 07 දිනැති ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී තිබුණ ද, මෙම වාර්තාවේ දින වන විටත් මාර්ගගත ලොතරැයිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ජාතික විශ්වවිද්‍යාල නොවන අනෙකුත් ආයතන වල අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වාරික මුදල් ගෙවීමේදී 2023 වර්ෂයේ අවස්ථා 23 ක දී මාස 04 සිට මාස 10 ක් දක්වා කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ඇ) අරමුදල් සපයා ගැනීමේ අරමුණින් 2023 දෙසැම්බර් 13 සිට 17 දක්වා ජාඇල නගර සභා ක්‍රීඩාංගනයේ මහපොළ වෙළඳ ප්‍රදර්ශනයක් පවත්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශනය අනුව වෙළඳ ප්‍රදර්ශනය මඟින් රු.29,046,884ක අලාභයක් සිදුවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල කොන්ත්‍රාත් පදනම මත වසර 02 ක කාලයක් සඳහා වෙළඳ ප්‍රදර්ශන සම්බන්ධීකරණ නිලධාරීන් 05 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරු 03 දෙනෙක් සඳහා පත්වීම් ලබාදී තිබූ අතර ඔවුන්ගේ පත්වීම් වල නීත්‍යානුකූලභාවය, බඳවාගැනීමේ ක්‍රියාවලිය, ඔවුන්ගේ දීමනා තීරණය කිරීමේ පදනම, රාජකාරී පැවරුම් කිරීම, රාජකාරී සඳහා වාර්තා

ාන, ආසන්නතම අධීක්ෂණ නිලධාරියා හා රාජකාරී ඉටුකිරීම සම්බන්ධයෙන් පිළිගත හැකි ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර එම නිලධාරින්ට 2023 ජූලි සිට 2024 පෙබරවාරි දක්වා කාලය සඳහා රු. 1,920,833 ක් වැටුප් හා දීමනා ලෙස අරමුදල විසින් ගෙවා තිබුණි.

(ඉ) යෝජිත ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ගම්මානය ඉදි කිරිම සඳහා හොරණ මිල්ලෑව වත්ත ඉඩමෙන් අක්කර 123 රූඩ් 2 පර්චර්ස් 29.7 ක ඉඩමක් මිලදී ගැනීම සඳහා 2021 දෙසැම්බර් 29 දින අරමුදල විසින් රු. 340,200,000 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණ ද 2023 ඔක්තෝබර් 24 දින එම අධිකාරිය විසින් අක්කර 117 රූඩ් 01 පර්චර්ස් 22.7 ක් සඳහා පමණක් හිස් කායික භුක්තිය ලබාදී තිබුණි. ඒ අනුව අරමුදලට අක්කර 6 රූඩ් 1 පර්චර්ස් 07 ක් අහිමි වී තිබුණු අතර රු. 17,311,224 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. එසේම,ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය අනුව ඉඩම වෙනුවෙන් නිදහස් දිමනා පත්‍රයක් ලබා දීම සඳහා ඉඩමේ වන්දි තක්සේරුව සම්පූර්ණ කල යුතු අතර මෙහිදි වන්දි තක්සේරුව සම්පූර්ණ වී නොමැති බැවින් නාගරික සංවර්ධන අධිකාරියට නිදහස් දීමනා පත්‍රයක් ලබා ගැනීමට හැකියාවක් ලැබී නොතිබුණි. ඒ අනුව 2024 අගෝස්තු 22 දින වන විටත් ඉඩම සම්බන්ධයෙන් අරමුදලට හිමිකම් ඔප්පුවක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවා ගැනීම සඳහා අරමුදල විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර තිබුණු අතර අරමුදල ස්වාධීන ආයතනයක් බැවින් එහි අනුශාංගික සියළු බලතල අරමුදලේ භාරකාර මණ්ඩලය විසින් සිදුකල හැකි බැවින් බඳවා ගැනීමේ පටිපාටිය සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලැබීම ප්‍රමාණවත් වන බවට එම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබුණි. එසේ වුවද , 2023 නොවැම්බර් 05 දින අරමුදලේ භාරකාර මණ්ඩලය විසින් තනතුරු හා අදාල බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීමට තීරණය කර ඒ සම්න්ධයෙන් එම දෙපාර්තමේනතුවෙන් ඉල්ලීමක් සිදු කර තිබුණ ද බඳවා ගැනීමේ පටිපාටිය සඳහා වාර්තාවේ දින දක්වාත් අනුමැතිය ලැබී නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 02 ක්, කළමනාකරණ මට්ටමේ තනතුරු 04 ම, සහ ද්විතීය, තෘතීය හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 10 ක් වශයෙන් අනුමත කාර්ය මණ්ඩලයේ මුළු තනතුරු 31 න් තනතුරු 16 ක් පුරප්පාඩුව පැවතුනි. අරමුදලේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු, සිසුන්ට මහපොළ ශිෂ්‍යාධාර ගෙවීමේ සහ ආයතනයේ පරිපාලන හා ගිණුම් කටයුතුවල කාර්යක්ෂමතාවය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

(ඟ) 2021 වර්ෂයේ දී වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත නිකුත් කල කාර්යාල උපකරණ සඳහා ලැබිය යුතු රු.1,021,450 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති